*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30*
*ISSN 1800-1459*

# සාරියː සංඥාර්ථවේදී ප්‍රවේශයක්

**සුලාරි ද සිල්වා**

**පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව**

## සාරසංක්ෂේපය

*සාරිය යනු, දොළොස් රියනක් පමණ දික් වූ රෙද්දක්, සිරුර වටා එතීමෙන් පිළියෙල කරගනු ලබන සාම්ප්‍රදායික ස්ත්‍රී ඇඳුමකි. එහි ඉතිහාසය වසර තුන් දසහසකටත් වඩා පැරණි විය හැකියැයි අනුමාන කෙරෙයි.*

*සංඥාර්ථවේදය, භාෂා ශාස්ත්‍රාදියෙහි ද, විවිධ විද්‍යාවන්ගේ ද සංඥාර්ථ විග්‍රහ කරනු පිණිස භාවිත වන න්‍යායාත්මක එළැඹුමක් ලෙස හඳුන්වාදිය හැකි ය. නූතනයේ ශාස්ත්‍රීය විමර්ශන සඳහා භාවිතයට ගැනෙන සංඥාර්ථවේදී න්‍යායයන් මෑතයුගයේ බිහිවුව ද, එහි මූලධර්ම මානව ශිෂ්ටාචාරයේ මූලාරම්භයේ පටන් ම, ශාස්ත්‍ර හා විද්‍යාවන් ඇසුරෙහි වර්ධනය වූ බව සඳහන් වෙයි.*

**කේන්ද්‍රීය වචනː** සරිය, ඇඳුම, ස්ත්‍රිය, සංඥා, සංඥාර්ථවේදය

## හැඳින්වීම

සාරියේ සංඥා ප්‍රකාර විග්‍රහ කොට දැක්වීම ද ශ්‍රී ලාංකේය සමාජ හා ආර්ථික සන්දර්භය තුළ සාරිය අර්ථ ගැන්වෙන ආකාරය පිළිබඳ විමසීම ද මෙම ලේඛනයේ අරමුණයි.

සාරිය යන්න සාම්ප්‍රදායික ස්ත්‍රී ඇඳුමක් ලෙස හඳුන්වා දිය හැකි වුවත්, වර්තමානය වනවිට සාරිය අරභයා පැවති පුරාණ පිළිවෙත් හා ඇගයුම්ː විවිධ සමාජ සංස්කෘතික සහ ආර්ථික ප්‍රවණතාවයන්ට අනුකූලව වෙනස්කම්වලට ලක්වෙමින් පවතී. එසේ හෙයින් සාරියේ සංඥාර්ථ විමසිය යුත්තේ එහි විවිධතාවන්ට හේතු වූ සමාජ-ආර්ථික සාධක පසුබිම් කොටගෙන ය.

සාරියේ සම්භවය සහ එහි කලානුරූප විකාශය පිළිබඳ මූලික කරුණු ද, සාරිය සහ නූතනත්ත්වය පිළිබඳ කරුණු ද එනම්, එහි උපයෝගීතාවන්, වෙළඳපොළ තත්ත්වය, අලෙවිකරණය හා පාරිභෝජනය පිළිබඳ කරුණු ද මෙම ලේඛනයෙන් අධ්‍යයනය කෙරෙයි.

## සාහිත්‍ය විමර්ශනය

ඇඳුම, සමාජ හා සංස්කෘතික ප්‍රපංචයක් ලෙස මෙන් ම එහි මනෝ විද්‍යාත්මක ලක්ෂණ ගැන ලියැවුණු සාහිත්‍ය මූලාශ්‍රය බොහෝ ය. ඇඳුමේ සන්නිවේදන ස්වරූපය පිළිබඳ ව ද විවිධාකාරයේ ශාස්ත්‍රීය මත පළ වී තිබේ. ඩියර්බෝන් (1918), ඇඳුම සන්නිවේදන පද්ධතියක් ලෙස අධ්‍යයනය කළ ශාස්ත්‍රඥයෙකු ලෙස හඳුන්වාදිය හැකි ය. හෝන් (1968) හා ලේවර් (1969) ද මෙම ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යනයේ නියැලුණු විද්වතුන් දෙදෙනෙකු වන අතර ඔවුහු, 'පෙනුම'

(appearance) මූලික කොටගෙන මානව ක්‍රියාකාරකම් සිදුවන ආකාරය සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කළහ.

එහෙත් ඇඳුම පිළිබඳ සිදු කරන ලද සංඥාර්ථවේදී අධ්‍යයනයන් ඇත්තේ ඉතා සීමිත ප්‍රමාණයකි. 1899 පළමුවරට ප්‍රකාශයට පත් වූ වෙබ්ලන්ගේ (1899) අධ්‍යයනයන්, ඇඳුම සමාජයේ ඇගැයුම් සංකේතවත් කිරීම උදෙසා භාවිත වන ආකාරය විමසුමට ලක් කළේ ය. පසුකාලීන ව, ලැස්වෙල් (1961) සහ කර්යේ (1973) යන ශාස්ත්‍රඥයෝ ද මේ පිළිබඳ අධ්‍යයනය කළහ. ඇඳුමෙ සංඥාර්ථ විග්‍රහ කරමින් රෝලන් බාත් (1967) විසින් රචනා කරන ලද *Systeme de la Mode* (The Fashion System) නමැති කෘතිය මේ පිළිබඳ මෙතෙක් ලියැවී විශිෂ්ටතම කෘතිය ලෙස සැලකේ. බාත් මෙම අධ්‍යයනය සඳහා පාදක කරගත්තේ ඇඳුම් විලාසිතා සඟරාවන් ය. ඔහු 'තත්‍ය' (real clothes) හා 'නිරූපිත' (represented clothes) වස්ත්‍රවල සංඥාර්ථ අධ්‍යයනය කළේ ය.

## පර්යේෂණ ගැටලුව

අන් සියලු ප්‍රපංචයන් හා ප්‍රකාශන ප්‍රකාරයන් සේ සාරිය සංඥාර්ථවේදාත්මකව විග්‍රහ කළ හැකි ද?

## පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනය, සාරිය පිළිබඳ ව සංඥාර්ථවේදාත්මක එළැඹුමකින් කෙරෙන ශාස්ත්‍රීය විමර්ශනයකි. ශ්‍රී ලාංකේය සමාජ හා සංස්කෘතික සන්දර්භය තුළ සාරිය සංකේතාත්මක ව අර්ථ ගැන්වෙන ආකාරය හා එහි විවිධාකාර වූ සංඥා ප්‍රකාර විවරණය කොට දැක්වීම මෙම ලේඛනයේ අරමුණ යි.

## පර්යේෂණයේ වැදගත්කම

අන් සියලු ප්‍රපංචයන් හා ප්‍රකාශන ප්‍රකාරයන් සේ, සාරිය සංඥාර්ථවේදාත්මක ව විග්‍රහ කළ හැකි ය. සාරිය සංඥාර්ථ පද්ධතියකි. සාරියේ සංඥාර්ථ ජනවාර්ගික හා ප්‍රාදේශීය විවිධතාවන් නිරූපනය කරයි; සමාජ-සංස්කෘතික සන්දර්භයන් තුළ විවිධ අර්ථ සන්නිවේදනය කරයි. ශත වර්ෂ ගණනාවක් පුරා සාරියේ සංඥාර්ථ සමාජ සම්ප්‍රදායයන් මත තීරණය කරනු ලැබූව ද, වර්තමානයේ එය තීරණය වන්නේ ආර්ථික ඇගැයුම් මත ය. එසේ හෙයින්, සාරියේ සංඥාර්ථ විමසනු පිණිස කරනු ලබන ශාස්ත්‍රීය අධ්‍යයනයන් එහි නිෂ්පාදන ක්‍රියාවලියේ දී ද, අලෙවිකරණයේ දී ද පරිභෝජනයේ දී ද - එනම් සාරියේ ප්‍රායෝගික උපයෝගීතාවන් සඳහා ද වැදගත් වනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම ලේඛනයෙහි පළමු භාගයේ විස්තර කෙරෙන ලක්දිව ස්ත්‍රී ඇඳුමේ විකාශනයේ සිට සාරියේ සම්භවය දක්වා වන ඓතිහාසික තොරතුරු පුරාණ ලේඛන හා දෘශ්‍ය මූලාශ්‍රය ඇසුරෙන් ද;

එහි පසුභාගයේ විමර්ශනය කෙරෙන සාරියේ නිෂ්පාදන ක්‍රමවේද, පරිභෝජනය හා වෙළඳපොළ තත්ත්ව ආදී වශයෙන් වන මෑතකාලීන තොරතුරු සහභාගී

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30*
*ISSN 1800-1459*

නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා ආදී ප්‍රාථමික පර්යේෂණ ක්‍රමවේද ඇසුරින් ද සපයාගන්නා ලදී.

දත්ත හා තොරතුරු විශ්ලේෂණයේ දී, සංඥාර්ථවේදයේ මූලික න්‍යායායන් සහ අර්ථ විග්‍රහයන් භාවිත කරන ලදී.

## සාකච්ඡාව

### සාරිය

සාරිය, දකුණු ආසියානු කලාපයට අයත් ඉන්දියාව, ශ්‍රී ලංකාව, සහ නේපාලය ආදී රටවල ස්ත්‍රීන් විසින් පරිහරණය කරනු ලබන සාම්ප්‍රදායික ඇඳුමකි.

සාරිය යනු, දොළොස් රියනක් පමණ දික් වූ තනි රෙද්දකි. කැපුමකින් හෝ මැස්මකින් තොර ව සිරුර වටා එතීමෙන් ම පමණක් මෙම දීර්ඝ රෙදි තීරුව ඇඳුමක් (සාරියක්) සේ පිළියෙල කරගැනේ. යටිකය වටා පළමුව ඔතාගන්නා රෙදි කඩ, පසුව හිස, උරස හෝ දසරුව මත්තෙහි රඳවා උඩුකය වැසෙන සේ හැඳීම මූලික ලක්ෂණය යි. එකස් කොට රැඳවීමෙන් ද, නැවීමෙන් ද, ගැටලීමෙන් ද, එතීමෙන් සහ පටළැවීමෙන් ද, ලිහිල් කොට මුදා හැරීමෙන් ද නාරුපොට (නෙරිය), වලුපොට සහ ඔපනැලි ආදී වූ සාරියේ අවශේෂ කොටස් විචිත්‍ර ලෙස පිළියෙල කරගැනීම සිදුවේ.

සැට්ටය (චෝලිය, කඤ්චුකය) සහ යටසාය සාරියේ අනිවාර්ය අභ්‍යන්තර වස්ත්‍ර ලෙස (වර්තමානයේ) භාවිතයට ගැනේ.

සාරියේ විචිත්‍රත්වයත් ශෝභමාන බවත්, සාරිය පිළිබඳ විවිධ සම්ප්‍රදායයන් ආදියත් සළකා බැලීමෙන් එය 'ස්ත්‍රී ලාලිත්‍යයේ සංකේතය' ලෙස ද, 'ස්ත්‍රී ඇඳුමෙහි මහා සම්ප්‍රදායය' ලෙස ද නම් කිරීම අතිශයෝක්තියක් නොවේ.

### සාරියේ ඉන්දීයානු සම්භවය

සාරියේ සම්භවය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට (ක්‍රි.පූ. 3500-1700) අයත් යැයි සැලකේ (Lynton, 1995). ඒ පිළිබඳ නිශ්චිත තොරතුරක් අනාවරණය කරගැනීම පිණිස හමුවන මූලාශ්‍රය අල්ප ය. එහෙත් සාරියේ විකාශනය ගැන කියැවෙන ඇතැම් තොරතුරක් පශ්චාත්කාලීන යුගවලින් හමුවන ලේඛන සහ දෘශ්‍ය මූලාශ්‍රය ඇසුරෙන් සපයා ගතහැකි ය.


ඒ අනුව, සාරියේ ඉපැරණි ම දෘශ්‍ය සාධකය සේ පිළිගැනෙනුයේ ඉන්දියාවෙන් හමුවන ශුංග සමයට (ක්‍රි. පූ. 200-50) අයත් තළඟන ප්‍රතිමාවකි (Lynton, 1995) (1 රූපය).

ඊට පසුකාලීනව එනම්, ගන්ධාර (ක්‍රි. පූ. 50 - ක්‍රි. ව. 200) හා ගුප්ත යුගවල (ක්‍රි. පූ. 200 - ක්‍රි. ව. 550) භාවිත වූ සාරියේ ප්‍රභේද ගණනාවක් හඳුනාගෙන තිබේ (2 රූපය). අජන්තා ලෙන්වල (ක්‍රි. ව. 5 සියවස) සිතුවම් හා කැටයම් ආශ්‍රිතව ද පුරාණ ඉන්දියාවේ විවිධ ජන වර්ග විසින් භාවිත කරන ලද නා නා විධ ඇඳුම් පැළඳුම් අතර සාරිය හෝ සාරියට සමාන ඇඳුම් පිළිබඳ සාක්ෂ්‍ය රැසක් හමුවේ.

ISSN 1800-1459



1 රූපය - නළඟන ප්‍රතිමාව - ශුංග සමයට (ක්‍රි. පූ. 200-50)
පිළිස්සූ මැටියෙන් කළ මෙම අර්ධ උන්නත ප්‍රතිමාවේ නිරූපිත ස්ත්‍රී රුව, සාරිය යැයි නියත වශයෙන් අනුමාන කළ හැකි සංකීර්ණ වස්ත්‍රයකින් ද, විසල් අභරණයෙන් ද අලංකෘත කොට නිමවා තිබේ. ඉණ දෙපස නරුපොටවල් විහිදී යන සේ දෙපා අතරින් මනාව ඔතා පිළියෙල කරන ලද එම වස්ත්‍රයේ වලුපොටි දකුණු උරස මත රඳවා ඇත.



2 රූපය - මායා දේවිය සහ පරිවාර ස්ත්‍රීන් - ගන්ධාර යුගය (ක්‍රි.ව.200)
සිදුහත් උපත, මායා දේවිය සාරිය ද පරිවාර ස්ත්‍රීහු කච්චා ධෝතිය හැඳ සිටිති.

මූලාශ්‍රය - Lynton, Linda (1995), The Sari, London, Thames & Hudson Ltd

## ලක්දිව ස්ත්‍රීන්ගේ ඇඳුමේ විකාශනය

> "පුරාණයේ ලක්දිව ස්ත්‍රීහු සාරි හෝ ඔසරි නො ඇන්දාහ. සාරිය හෝ ඔසරිය ද එවැනි උඩුකය වසා අඳින ලද වෙනත් වස්ත්‍ර ද ස්ත්‍රීන් අතර ප්‍රචලිත වූයේ ඉතා මෑත යුගයක සිට ය. නව වන ශත වර්ෂය පමණ වන තුරු කුලීන සිංහල ස්ත්‍රීහු පවා උඩුකය නොවැසුහයි නිශ්චය කළහැකි සාක්ෂ්‍ය පුරාණ සිතුවම්වලින් මෙන් පොතපතින් ද ලැබේ" (වික්‍රමසිංහ, 1935:39).

සාරිය සහ ඔසරිය දහ අට - දහ නවය සියවස්වල සිට මෙරට කුල ස්ත්‍රීන් විසින් පරිහරණය කරන ලදුව සාමාන්‍ය ස්ත්‍රීන් අතර ද ප්‍රචලිත වූවා යැයි නිගමනය කළ හැකි ය.

*ISSN 1800-1459*

සිංහලයන්ගේ හා පුරාණ ලක්දිව වැසියන්ගේ ඇඳුම, උතුරු ඉන්දියාවේ ජනයාගේ ඇඳුමෙහි කාලානුරූප විකාශයකැයි ද, එසේ නැතහොත් එය කෙළින් ම උතුරු ඉන්දියාවේ ආර්යයන්ගෙන් නොව දකුණු ඉන්දියාවේ ජනයා අතින් දූෂණය වීමෙන් පසු ලැබිණැයි ද (වික්‍රමසිංහ, 1935:39) නිගමනය කළහැකි වුවත් මෙරට සාමාන්‍ය ජනයා අතර ප්‍රචලිත වූ වෙනම ඇඳුම් සම්ප්‍රදායයක් පවතින්නට ඇතැයි සිතිය හැකි සාධක ද විරල නොවේ.

පූර්ව ඓතිහාසික යුගයේ පටන් ම මෙරට විසූ ජනයා කපු කැට නූල් තනා රෙදි වියමන් කළෝ යැයි වංශකතාදියෙහි සඳහන් වෙයි. විජයගේ ලංකාගමනයේදී කුවේණිය කපු කටිමින් සිටි බවත්[1] (මහාවංශය 7.11) සංඝමිත්තා තෙරණිය සමඟ මෙරට පැමිණි ශිල්ප ශ්‍රේණී දහ අටට අයත් පිරිසෙහි පෙහෙර කුල ශිල්පීන් ද සිටි බවත් (මහාවංශය 10.2) සඳහන් වෙයි. මෙසේ, අනුරාධපුර යුගය වනවිට පේෂකර්මය මෙරට පැවති ප්‍රධාන කර්මාන්තයක් බවට පත්ව තිබූ බවට තොරතුරු හෙළිවෙයි. කදුරු වැව ශිලා ලේඛනයේ සඳහන් පරිදි පේෂකාර්මිකයන් උදෙසා කරවන ලද වැවක් ද, එම ශිල්පීන්ගේ වාසය පිණිස කරවන ලද ජංඝලඹය නම් ග්‍රාමයක් ද තිබූ බවට ලැබෙන තොරතුරු, පුරාණයේ මෙරට පැවතියා වූ පේෂකර්මාන්තයේ තරම කියාපායි. කෙසේ වුව ද, පුරාණයේ ලක්දිව ජනයාගේ වස්ත්‍ර භාවිතය අතිශයින් ම සරල වූ බව සඳහන් කළ යුතු ය. රෙදි අතින් ම වියා පිළියෙල කරගන්නා ලද බැවින් හා ශිල්ප ප්‍රාගුණ්‍යයෙන් හෙබියා වූ පේෂකාරයන් බහුල නොවූ බැවින් ගැමුණු රජ කාලයේ (ක්‍රි. පූ. 161) පවා ප්‍රත්‍යයන්තයේ ජනයාගෙන් වැඩි පක්ෂයකගේ ඇඳුම (1) වල් කොළ හෝ තෘණ පත්‍රාදියෙන් වියූ වස්ත්‍ර (2) යම්තම් විළි වසා ගත් රෙදි කඩ (3) එසේත් නැතිනම් නග්නත්වය යැයි අනුමාන කළ හැකි සාක්ෂ්‍ය ලැබේ (වික්‍රමසිංහ, 1935:105).

ලංකාවෙන් හමුවන පුරාණ ලේඛන, බිතුසිතුවම්, මූර්ති කැටයම් ආදියෙහි නිරූපණය වන ආකාරයට පුරාණ ස්ත්‍රීන්ගේ ඇඳුම වූයේ යටිකය වසා අඳින ලද **අන්තරීය**[2] නම් වූ රෙදි කඩෙකි (Serasinghe, 1960). අනුරාධපුර උත්තර ස්තූපය ආශ්‍රිත ව හමුවූ අමරාවතී ශිල්ප සම්ප්‍රදායට (ක්‍රි. ව. පළවන සියවස) අයත් එවැනි වස්ත්‍ර දරන ස්ත්‍රී රූ සහිත කැටයම් ඒ සඳහා මෙරටින් හමුවන පුරාණත ම දෘශ්‍ය සාධකය ලෙස සැළකිය හැකි ය.

පහත දැක්වෙන්නේ (3-4 රූප) ශරීර ලාලිත්‍යයෙන් ද, අති විසිතුරු වස්ත්‍රාභරණයෙන් ද හෙබියා වූ අමරාවතී ශිල්ප සම්ප්‍රදායට[3] අයත් එවැනි කැටයම් ද්වයකි. එය වර්මානයේ ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ස්ත්‍රීන් විසින් අඳින ඇඳුම මෙන් ඔතා අඳින දිගු රෙදි කඩක් වන අතර, සේලය දෙපා අතරින් පිටුපසට ගෙන ගැටයක් යොදා ඉණෙහි රඳවා ඇත. මේඛලාව නම් බඳ පටියක්

---

[1] මෙරට ස්ත්‍රීහු ඉණ වටා ඔතන ලද වැල් පොටක අමුණන ලද වල් කොළයෙන් හෝ රුක් සිවියෙන් වියූ **ඉණ හැදය** නම් වස්ත්‍රයක් ඇන්දාහුය. එකල මතු නොව පශ්චාත් කාලීන යුගවල පවා කුසතණ ගොතා කළ ඉණ හැද ඇඳි බවට පොතපත සාක්ෂි සපයයි (වික්‍රමසිංහ 1935)

[2] **අන්තරීය** - යට අඳන රෙද්ද; නිවාසනය; අන්තරවාසකය; (සිංහල ශබ්දකෝෂය, (1965) පස්වන කාණ්ඩය කොළඹ, රාජකීය ආසියාතික සමිතිය, ලංකා ශාඛාව)

[3] භාර්හුත්, අමරාවතිය යන දෙතැන කැටයම් කරන ලද ජාතක වස්තුවෙහි පෙනෙන ස්ත්‍රීහු ද, පුරුෂයෝ ද අධික නග්න ලක්ෂණ ඇත්තෝය. ඇතැම් ස්ත්‍රියකගේ ඇඳුම් එල්ලෙන වලු පටක් සහිත නරු පටක් පමණි. මේ රූප ආභරණයෙන් බර වූවත් රෙදි පිළියෙන් නම් ඉතා සැහැල්ලුය. ජාතක වස්තුන් කියන ස්ත්‍රීන් පුරුෂයන් පමණක් නොව මහාමායා බිසව සහ වෙනත් ස්ත්‍රීහු ද ඉණ වටා බැඳි රෙරි පොටකට වැඩි විළි වැසුම් නැත්තෝ ය (වික්‍රමසිංහ 1935: 23)

ISSN 1800-1459

ද ඉණවටා දක්නට ලැබේ (Serasinghe, 1960). ක්‍රි.පූ. හතරවන සියවසට අයත් ලෝකඩ පත්තිනි රුවක ද මීට සමාන ඇඳුමක් දක්නට ලැබෙයි (Serasinghe, 1960).



**3 රූපය** - යක්ෂණී රුවක් (ක්‍රි.ව. 4-5 සියවස) අනුරාධපුර උත්තර ස්තූපය ආශ්‍රිත ව හමු වූ කැටයමකි. ඉණ වටා අලංකාර නරු පොට සහිත වූ සුමට වස්ත්‍ර හැඳ, ආභරණ පැළඳ සිටියි.



**4 රූපය** - මායා දේවිය සහ පරිවාර ස්ත්‍රීන් (ක්‍රි.ව. 4-5 සියවස); අනුරාධපුර උත්තර ස්තූපය ආශ්‍රිත ව හමු වූ කැටයමකි. සිදුහත් උපත සඳහා මායා දේවිය සහ පරිවාර ස්ත්‍රීහු සාල වනයට යන දර්ශනයක්, ඉණ වටා අලංකාර නරු පොට සහිත වූ සුමට වස්ත්‍ර හැඳ, ආභරණ පැළඳ සිටිති.

මූලාශ්‍රය - The Cultural Trangle of Sri Lanka (1993), Colombo, UNESCO publication

ක්‍රි. පූ. පස්වන සියවස වන විට ද ඉහත කී ඇඳුම් පිළිවෙත්වල වෙනසක් දක්නට නොලැබිණි. සීගිරි සිතුවම්වල රජ බිසෝවරුන්ගේ සහ පරිවාර ස්ත්‍රීන්ගේ රූ, උඩුකය නිරාවරණ ව නිරූපණය කොට තිබේ. ඇතැම් ස්ත්‍රී රූපයක්, තනපටයක් හෝ කඤ්චුකයක් යැයි කිව හැකි උඩුකය ඇඳුමකින් යුක්ත ය. යටිකය වස්ත්‍රය ධෝතියට සමාන ලෙස ඔතා ඉණ නරුව තබා හැඳි සේලයක් සේ දිස්වේ. ඒවා විවිධ වර්ණයෙන් යුක්තය. ශරීරය ආභරණාදියෙන් ද හිස මලින් ද සරසා තිබේ.

> "පෙළෙම්බු බලය් බෙයන්දිහි රන්වනක් දුටි මය්
> නුයුන් අත්නි රා ගත් සුරතින් නගයි **ඔසැරියෙ** ලය්
>
> බෙයදෙහි විසි රන්වන් එකියක් රතුවන් ඇස් කොනින්
> මදෙස බලා සුරත නගා ඔසැරියෙහි ලා ඇ දුටු මා
> පෙළඹවූවාය" (මුදියන්සේ, 1963)

ISSN 1800-1459

එවන් වූ පියකරු ස්ත්‍රී රුවක් දැක්මෙන් සිත් පහදවා ගත් අයෙකු විසින් ලියන ලද කුරුටු ගී අතුරෙහි ස්ත්‍රී ලාවන්‍යය සේම ඇඳුම් පැළඳුම් ගැන වන වර්ණනයන් ද කලාතුරකින් වුව හමුවේ. **උතිරිය, ඔසැරිය** ආදී වශයෙන් සටහන් වූ, ඇඳුමක් ගැන හැඳින්වෙන ඇතැම් යෙදුමක් ඒවා අතරෙහි මෙසේ හමුවෙතත් ඒ යෙදුම් කවරාකාරයේ වස්ත්‍ර හඳුන්වනු පිණිස භාවිත කළේ ද යන්න නිශ්චය කළ නොහැකි ය.

> "සීගිරි සිතුවම්වලට අවුරුදු හත් සීයකින් පමණ මොබෙහි කරන ලද පොළොන්නරුවෙහි දෙමළ සෑයෙහි සිතුවම් ද ස්ත්‍රීන් උඩුකය වැසූ බව නොකියයි" (වික්‍රමසිංහ, 1935:58).

පොළොන්නරුව තිවංක පිළිම ගෙහි සිතුවම් හා කැටයම්වල මෙන් ම පොළොන්නරු යුගයට අයත් බොහෝ දේව ප්‍රතිමාවල නිරූපිත වස්ත්‍රයන් ද මෙවැනි ම ලක්ෂණවලින් යුක්ත වූවේ වෙයි. එකල ඉන්දියානු හා හින්දු ආගමික බලපෑම් මෙරට ප්‍රබල ලෙස ව්‍යාප්ත ව පැවතියත්[4] සාරිය හෝ එවැනි උඩුකය වසා පෙර වූ වස්ත්‍රයක් ගැන නම් තොරතුරක් පොළොන්නරු යුගයෙන් ද හමුනොවේ.

මූර්ති කැටයම් ආදියෙහි මතු නොව, ලිඛිත සාධක ඇසුරෙහි ද පුරාණ ස්ත්‍රීන් උඩුකය වසා නොඇඳි බවට තොරතුරු හමුවෙයි. කුල ස්ත්‍රීන් උඩුකය වැසීම අගෞරවයක් කොට සැළකූ බවත් පාත් පන්තියේ ස්ත්‍රීන් උඩුකය නොවසා රෙදි කඩක් පමණක් හැඳි බවත් එකල පැවැති සමාජ සිරිත් ලෙස පුරාණ ග්‍රන්ථයන්හි දක්වා ඇත.

> "ධම්මපදට්ටකථායෙහි (පස් වන ශත වර්ෂය) එන රෝහිණී වස්තුව ඒ බව නිදසුන් කොට දක්වයි. රෝහිණිය සියල් සිරුර වසා ඇති වූ ඡවි රෝගයක් නිසා ඇඟ ලාගෙන සිටි **කඩ කඤ්චුකය (කට කඤ්චුකං)** ගලවා තබා අනුරුද්ධ ස්ථිරයන් වෙත පැමිණියා යැයි සඳහන් වේ. ඊට අවුරුදු පන්සියයකින් පමණ මෙපිටදී (දහ වන ශත වර්ෂය - ක්‍රි. ව. 918 හෝ 929) රචනා කළ ධම්පියා අටුවාගැටපදයෙහි ද සඳහන් ඉහත කථාවෙහි ම රෝහිණිය එසේ සැට්ටය (**පට කඤ්චුකං - පෙරෙව් පට**[5]) උනා තබා ආයේ තෙරුන්වහන්සේ කෙරෙහි වූ ගෞරවයෙනැයි පවස යි" (වික්‍රමසිංහ, 1935:40).

පුරාණයේ නියම වූ පරිද්දෙන් කුලහීනයන් ඉණෙන් පහළ දෙදණ දක්වා අඳින ලද්දේ රෙදි කඩක් පමණකි. උඩුකය වැසීම කිසිසේත් නොකට යුතු ය. එම රෙදි කඩ වුව සපයා ගත නුහුණු කල ඔවුහු කිළිටි වැරහිළි ම ඇන්දෝ ය. සද්ධර්මරත්නාවලියේත්, බුත්සරණේත් එන පටාචාරා වස්තුවෙහි පටාචාරා සිටු දියණිය මිඩියන් සේ (පාත් පන්තියේ ස්ත්‍රීන්) කිළිටි කඩක් හැඳි බව ආදී වූ පවත් නිදසුන් කොට දැක්වීමෙන් එකල කුලහීන ස්ත්‍රීන් විසින් යටිකය වසා අඳින ලද්දේ කෙටි රෙදි කඩක් බැව් පෙන්වා දිය හැකි ය.

---

[4] චෝල පාලන සමය වසර සියවසකට අධික කාලයක් පැවතුණි

[5] එම ග්‍රන්ථයන්හි සඳහන් වන පට කඤ්චුකය හා කඩ කඤ්චුකය යනු දෙවුර වසා පොරවන ලද රෙද්දක් හෝ නැතහොත් මැසීමෙන් පිළියෙල කරගත් සැට්ටයක් දැයි නිශ්චය කළ නොහැකිය

> "උඩුකය වැසීම කුමක් අරභයා ලක්දිව ජනයා අතර ප්‍රචලිත වී දැයි දත නොහැකි ය. දහ තුන්වන ශත වර්ෂයේ ලියන ලදැයි සැළකෙන සද්ධර්මරත්නාවලිය ඉහත කියන ලද රෝහිණී වස්තුව ම "හෙළි බසින්නට ලජ්ජා වන තරම් කුෂ්ඨ රෝගයෙක් සියල් සිරුරු වසා ඇති විය. ඒ නිසා ලජ්ජායෙන් නො ආ බව මුත් නිහර සරව නොවෙයි" යනුවෙන් වස්ත්‍ර පිළි ආදිය ගැන කිසිවක් නොදක්වා කියන ලද්දේ සද්ධර්මරත්නාවලිය රචනා කරන ලද කාලයෙහි එනම් දහ තුන්වන ශත වර්ෂය වන විට කුල ස්ත්‍රීන් උඩුකය නොවැසීම ක්‍රමයෙන් වෙනස්වීගෙන ගිය හෙයින් විය හැකි ය" (වික්‍රමසිංහ, 1935:107).

මෙසේ හැඳගත් කඩින් පටක් හැඳගෙන පටකින් දසරුව වසාගෙන හෝ තවත් කඩකින් උඩුකය (උතුරු සළුව) වසාගෙන ගෙන් පිටත යාම කුලීන හා මධ්‍යම පන්තියේ ස්ත්‍රීන්ගේ සිරිත වීයැයි කිව හැකි සාක්ෂ්‍ය එම මූලාශ්‍රය ඇසුරෙන් ම සපයාගත හැකි ය. පුරාණ සිංහල කවීහු ස්ත්‍රියගේ **උතුරු සළුපට** ගැන කියතත් කඤ්චුකයක් ගැන නොකියති (වික්‍රමසිංහ 1935:109). කපා මසා ඇඳුම් පිළියෙල කර ගැනීම එකල සිරිත් නොවී. තනපටයක් වැනි වස්ත්‍රයක් හැඳීමට පෙර සහ ඊට සමකාලීන යුගයෙහි උඩුකය ආවරණය කරගනු පිණිස ස්ත්‍රීන් විසින් භාවිත කරන ලද්දේ **උත්තරිය**[6] නම් වූ වස්ත්‍රයකි (Serasinghe, 1960).

> "පස්වන සියවසෙන් පසුකාලයේ ලක්දිව ස්ත්‍රීන් විසින් සාලු වැනි, බරෙන් අඩු නූලෙන් කළ **ලොන්සොළු** නම් උරහිස වටා දැමූ රෙදි කඩක් හැඳ තිබේ. යට කය වසා ඇන්දේ **සෝමනය** නම් වූ වස්ත්‍රයකි" (Rathanasara, 1954).

දහ සතර වන සියවස පමණ වන විට ලක්දිව උතුරු ප්‍රදේශවල දෙමළ රාජධානි වර්ධනය වෙමින් පැවතුණි. මෙකල යාපනේ රජුන්ගේ ආක්‍රමණ දරුණු වූයෙන් සිංහල රජවරු රජරට ප්‍රදේශයේ පැවැති රාජධානි උඩරට ප්‍රදේශයේ ගම්පොළටත්, සතර කෝරළයේ දඹදෙණියටත් ගෙන ගියහ. කාලයක් ඇවෑමෙන් සිංහල රදළ ප්‍රභූවරුන්ගේ සම්ප්‍රදායයන් උඩරට හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රචලිත වූ අතර දෙමළ ජනසම්ප්‍රදායයන් යාපනය හා උතුරු ප්‍රදේශවල ව්‍යාප්ත විය.

මහනුවර යුගයේ හෝ ඊට පශ්චාත්කාලීන යුගවල විහාර බිතුසිතුවම්, සාරිය, ඔසරිය හෝ එවැනි වෙනත් වස්ත්‍රයක් පිළිබඳ සාක්ෂ්‍ය සපයා ගත හැකි කදිම මූලාශ්‍රය සේ සැළකිය හැකිවුවත් ඒ ඇසුරෙහි පවා එවැනි වස්ත්‍රයක් පිළිබඳ කිසිදු සාධකයක් හමුවන්නේ නැත. මහනුවර යුගයේ කිසිදු චිත්‍රයක නොපෙනෙන හෙයින් එවැනි වස්ත්‍රයක් දහ අට වැනි සියවසෙහි ද විරල බව පෙනේ (කුමාරස්වාමි, 1901). මහනුවර සමයට අයත් මැදවල විහාරයේ ජාතක කතාවක දැකිය හැකි ස්ත්‍රී රුවක්, මන්තය සහිත දිගු අත් ඇති සැට්ටයකින් ද ඉදිරිපසට වන්නට නරුව තබා ඇති රෙද්දකින් ද යුක්ත ව නිරූපණය කොට තිබේ. රෙද්ද විචිත්‍ර මෝස්තරවලින් යුක්ත ය. සේවිකාවක යැයි සිතිය හැකි තවත් ස්ත්‍රියකගේ ඇඳුමක් තනි සුදු හෝ ලාපැහැති යටිකය වස්ත්‍රයක් ලෙසට ඇඳ දක්වා තිබේ. ඊට සමකාලීන අවධියක කරන ලදැයි සැලකෙන දෙගල්දොරුව විහාරයේ

[6] **උත්තරිය** - උත්තරීය : උඩින් පොරෝනා වස්ත්‍රය; උතුරු සළුව; උත්තරා සංගය; උතිරික; උතුරි සස (උතිරිය-සීගිරි II); (උත්තරීය - ධම් ප්‍රදීපිකාව)/ උතුරු සළු පට; උතුරු සළුව (උත්තරීය - ධම් ප්‍රදීපිකාව) සධම්ාලංකාරය 304-4; කාව්‍ය ශේඛරය 41; ගුත්තිලය 391/ උතුරු පට පිළිය, උතුරු පට සළුව, උත්තර සාටකය (සිංහල ශබ්දකෝෂය 1965)

කැටයම්වල ස්ත්‍රීන් ඇඳ සිටින්නේ ධෝතියට සමාන ඇඳුමකි. දහ අට වන සියවසට අයත් මහනුවර ගංගාරාමයේ සිතුවම්වල නිරූපිත ස්ත්‍රීහූ සැට්ට හා බොලට දක්වා දිගු යටිකය වස්ත්‍රවලින් සැරසී සිටිති. එහි තවත් සිතුවමක, මාර දූවරුන් නිරූපණය කොට දක්වා ඇත්තේ ඉදිරිපස නරුව තබා බොලට වඩා මදක් ඉහළින් ඇඳ ඇති වස්ත්‍රයක් සහිත ව ය. ඒ ස්ත්‍රීහූ රෙද්දේ කෙළවර, පොටක් සේ පිටතට ගෙන අත්ල මත රඳවා ගෙන සිටිති. මේ ආකාර වූ වස්ත්‍රවලින් සැරසී රංගන ලීලාවෙන් නිරූපිත මාර දූවරුන්ගේ සිතුවම් දඹුලු විහාරයේ ද තවත් විහාර බොහොමයක ද දක්නට ලැබේ.

දහසය වන සියවසෙන් පසුව පෘතුගීසි හා ලන්දේසි ආක්‍රමණවල බලපෑම්වලට නතුවීමෙන්, ලක්දිව බටහිර ප්‍රදේශවල ජනයා විසින් අනුගමනය කරන ලද්දේ වෙනස් ආකාරයක සමාජ පැවතුම් හා සම්ප්‍රදායන් ය. කෙසේ වුව ද මේ සමාජ පිළිවෙත් සුවිශේෂ වූයේ රාජකීයයන්ට හා ප්‍රභූ ජනයාට පමණකි. ලක්දිව සෑම ප්‍රදේශයක ම පාහේ වාසය කළ සියලු ජන වර්ගවලට අයත් පොදු ජනයා අතර පැවති සමාජ පිළිවෙත්වල - ඇඳුමේ හා පැළඳුමේ - වෙනස්කම් දක්නට ලැබුනේ ස්වල්ප වශයෙනි. එකල **ඔසරි**[7] ඇන්දෝ උඩරට කුල ස්ත්‍රීහු ය. පහතරට කුලීන ස්ත්‍රියක විසින් අඳිනා ලද්දේ සැට්ටයක් හා විසිතුරු රෙද්දකි. සාමාන්‍ය ස්ත්‍රියක විසින් **සරුවාලයක්** මෙන් දවටා ගත් **අඳනකඩය** හෙවත් **පාදය** නම් වූ වස්ත්‍රයක් ඉණෙන් පහළට ඇඳි අතර, ගෙන් බැහැර යන කල උත්තර සළුවක් උරහිස වටා දැවටීම සිරිතක් ව පැවතියේ ය (Knox, 1958). පහත් ජනයා ඉණේ දැවටි කුඩා රෙදි කඩක් ඇතිව හෝ සම්පූර්ණ නග්නව හෝ සිටියහ. පසුකාලීන ව හතරැස් රෙදි කඩක දෙකොණක් ගෙල වටා ද දෙකොණක් ඉඟටිය වටා ද ගැට ගැසීමෙන් උඩුකය ආවරණය කර ගැන්මට ඒ කුලවල ස්ත්‍රීහූ පෙළඹුණහ (හෙට්ටිආරච්චි 1967). මේ රෙදි පිළි, කපු හෝ හණ ආදියෙන් කළ ඒවා ය. පෘතුගීසි ලන්දේසි යුග වන විට යාපනයේ ස්ත්‍රීන් ද උඩුකය නිරාවරණ ව තබා ධෝතියට සමාන යටිකය ඇඳුමක් ඇඳීමට හුරු ව සිටි බවට තොරතුරු ලැබේ (Serasinghe, 1960).

කුමාරස්වාමි (1907) දක්වන ආකාරයට මේ වනවිට, ලක්දිව උඩුදුම්බර ප්‍රදේශය ආශ්‍රිත ව සාම්ප්‍රදායික ව පැවත ආ රෙදි වියමන - පේෂකර්මය-, ඉන්දියානු ශිල්පීන් විසින් යාපනයේ ද, මුස්ලිම් ජාතිකයන් විසින් මඩකලපුව ප්‍රදේශයේ ද, විශේෂ ප්‍රාගුණ්‍යකින් යුතු ව පවත්වා ගෙන යන ලදී.

ඉංග්‍රීසි අධිරාජ්‍යවාදී පාලන සමයට පෙර එනම්, සිංහල රාජ වංශයේ අවසාන යුගවල මෙරට පාලකයන් වූවෝ දකුණු ඉන්දියානු සම්භවයක් හිමි රාජවංශිකයන් හෝ වෙනත් එවැනි ජනවංශයක රජවරු ය. ඔවුන්ගේ සරණබන්ධනය පිණිස වරින් වර කුමරියන් මෙරටට ගෙන්වා ගත්තේ ඉන්දියාවෙනි (මදුරා පුරය, වංග දේශය ආදී වූ ප්‍රදේශවලිනි). එකල ඉන්දියාවේ පැවැති ඇඳුම් පිළිවෙත්, එකුමරියන් හා පැමිණි පරිවාර ජනයාගෙන් මෙරට ප්‍රචාරය වන්නට ඇතැයි සිතිය හැකි වුවත් සාරිය හෝ ඔසරිය වැනි වස්ත්‍රයක් ඔවුන් විසින් හැඳි බවට සාධක නැත. මේ රජ බිසෝවරුන්ගේ ඇඳුම වූයේ සැට්ටය හා සේලයයි (රූපය 6). ආලේඛ්‍ය

[7]**ඔසරිය** (කාන්තාවන්) උඩුකය වසා පොරවන රෙද්ද; උතුරු පට; උතුරු සළුව; පත්තිනි 17, ගුත්තිලය 391, "දිලි ගඟුල් හැලි ඔසරි ලා" හංස 144. **ඔසැරිය** - ඉණ වටා රැළි දමා පොටක් පහතට වැටෙන සේ එක් උරයක් වසා අඳින වස්ත්‍රය; උඩරට සාරිය: මෙය විශේෂයෙන් උඩරට ස්ත්‍රිය අඳින මෝස්තරයකි (ඔසොරිය, ඔහරිය, ඔලුහාරිය), **ඔහොරිය** කුලීන කාන්තාවන්ගේ ඔහොරිය හෝ රෙද්ද (සිංහල ශබ්දකෝෂය 1965)

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459

රුවක දක්නට ලැබෙන ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ බිසව, වෙන්කත රංගජම්මාල් හැඳ සිටින්නේ එවැනි වස්ත්‍රයකි; සැට්ටය හැඳ ඒ මත්තෙහි අගනා උතුරු සළුවක් පොරවා ගෙන සිටියි.



**5 රූපය** - උඩරට ස්ත්‍රියක්

යටිකයට ඇඳි වස්ත්‍රයේ කෙලවරක් උරහිසට පිටුපසින් ගෙන ඉදිරිපස නෙරිය තබා ඔසරියක් සේ ඇඳ ඇත. පොට කෙළවර තුඩක් සේ සකස් කර ඇත. ආභරණ පැළඳ සිටිය ද පාවහන් රහිත ය. ඔසරිය මෝස්තරවලින් යුක්තයි.



**6 රූපය** - රජ බිසවක්

ගෙත්තම් කළ අත් කොට හැට්ටියක් ඇඳ කර වටා මන්තයක් දමා සිටියි. යටිකයට ඇඳ සිටින්නේ ඇස් වට තෙක් වැටුණු රන්කවණි සේලයකි. එය යටිකය වටා අලංකාර ලෙස දැවටීමෙන් පිළියෙල කරන ලද්දකි. පාවහන් හා ආභරණ පැළඳ සිටියි.

මූලාශ්‍රය - Davy, John (1821), An Account of the Interior of Ceylon and of its Inhabitants with Travels in that Island

එහෙත් ඉන්දියානු කුමරියන්ගේ හා බිසෝවරුන්ගේ ඇඳුම් පිළිවෙත් අනුකරණය කරනු වෙනුවට සිංහල කුල ස්ත්‍රීන් **ඔසරිය** වැනි වෙන ම වස්ත්‍රයක් හැඳීමට ප්‍රිය කළ බවක් පෙනේ (Davy, 1821). මේ ස්ත්‍රීහු පාද දක්වා වැසෙන රෙද්දක් ඉණ වටා දවටා ඉන් එක් කෙළවරක් වම් උරහිසින් පිටුපසට දමාගනිති. මෙය හැඳින්වූයේ **හේලය** නමිනි (රූපය 5) (Davy, 1821). ඔවුහු පිරිමි පාර්ශවය මෙන් හිස ආවරණය කර නොගනිති. මෙසේ, සිංහල වංශවත් බව හැඟවීමට ඔසරිය වැනි වස්ත්‍රයක් රදළ කුල ස්ත්‍රීන් විසින් අඳින්නට හුරු වූවායැයි සිතිය හැකි වුවත් **ඔහොරියේ** සම්භවය ද ද්‍රවිඩ බවට නම් සැකක් නැත (කුමාරස්වාමි, 1901).

ISSN 1800-1459

වික්‍රමසිංහ (1935:26-27) දක්වන ආකාරයට සිංහල භාෂාවේ සම්භවය උතුරු ඉන්දියාවෙහි වුව ද ලක්දිව සමාජ සම්ප්‍රදාය ලැබුණේ දකුණු ඉන්දියාවෙනැයි පිළි ගැනේ. දකුණු ඉන්දියාවේ ආන්ධ්‍ර, තෙළිඟු, කණ්ණාට, දෙමළ ජනයාගේ සිරිත් විරිත් ඇඳුම් පැළඳුම් මෙරට ප්‍රචලිත විය. ලක්දිව ස්ත්‍රීන් අතර ප්‍රචලිත සාරිය කේරළ දේශයේ ආභාසය ඇතිව මෙරටට ලැබුණු බවට අනුමාන කෙරෙයි (Lynton, 1995:126).

දහනව වන සියවස අගභාගයේ පටන් සියවසක පමණ කාලය - එනම් ඉංග්‍රීසි පාලන සමයේ අවසාන යුගයේ සිට නිදහසෙන් පසු අවධිය දක්වා - මෙරට විසූ සෑම ජනකොටසකගේ ම ඇඳුම්පැළඳුම් අරභයා වන තීරණාත්මක කාලවකවානුව සේ සැලකිය හැකි ය. වැඩවසම් සමාජ ක්‍රමයක් යටතේ පැවති යැපුම් ආර්ථිකයෙන් බැහැරවුණු නව සමාජ සංස්කෘතියක් මෙරට ස්ථාපිත විය.



**7 රූපය**-හෙද සේවක පිරිසක් Lady Havelock Hospital for Women in Colombo (1899)

මූලාශ්‍රය - Jayawardane, Kumari, (1993) Dr. Mary Rutnam: A Canadian Pioneer for Women's Rights in Sri Lanka

- රේන්ද, පතල් හා වැවිලි ක්ෂේත්‍ර මූලික කොටගත් නව ව්‍යාපාරික ධනවතුන් පිරිසක් බිහිවීම - පහතරට ව්‍යාපාරික ධනවතුන්ගේ භාර්යාවෝ ද, දියණිවරු ද බටහිර පන්නයට දිගු ගවුම්, සාය, (දිගු අත් සහ කරවටා මන්ත සහිත) සහ අලංකාර සැට්ට ඇන්දෝ ය; හිස් වැසුම් ද, පාවහන් ද, වටිනා ආභරණ ද පැළැන්දෝ ය.

- වෙළඳ නගර බිහිවීම (නාගරීකරණය) - කර්මාන්තශාලා, පරිපාලන ගොඩනැගිලි, අලෙවිසැල් බහුල නගර බිහිවීමෙන් මහජනයාට (මධ්‍යම පාන්තික) විවිධාකාර වූ භාණ්ඩ මිලට ගත හැකිවිය. පිටරටින් ගෙන්වන ලද නව පන්නයට ඔබින රෙදි පිළි, ඇඳුම් ආයිත්තම් නාගරික අලෙවි සැල්වල සුලබ විය. ප්‍රවාහනය හා ගමනාගමන කටයුතු වර්ධනය විය.

- නව කර්මාන්ත හා වෙළඳාම් බිහිවීම - දේශීය කර්මාන්ත වර්ධනය විය. කෘෂි භෝග, ගෘහ භාණ්ඩ හා අත්යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදන ආදිය ඒ අතුරෙන් ප්‍රමුඛ විය. රට තුළ මේ සඳහා හොඳ වෙළඳාපොළක් බිහිවිය.

- ශිල්ප තාක්ෂණ භාවිතය - වඩු, පෙදරේරු, කුඹල් ආදී පාරම්පරික ශිල්ප කර්මාන්ත සඳහා වැඩි ප්‍රස්තාවක් හිමි වූ අතර ඒවායේ නිෂ්පාදනය ද අලෙවිය ද වර්ධනය විය. ඇඳුම් පිළිබඳ ව නම්, රේන්ද හා බීරළු ගෙත්තම්, එම්බ්‍රොයිඩරි වැනි මැහුම් වැඩ ප්‍රභූන්ගේ භාවිතාව සඳහා පමණක් නොව සාමාන්‍ය ජනයා අතර ද ජනප්‍රිය විය. මහන මැෂිම මෙරටට හඳුන්වාදීමෙන් අනතුරුව විවිධ හැඩ සහිත ඇඳුම් පිළියෙල කර ගැනීම ස්ත්‍රීන් අතර ජනප්‍රිය විය (Wickramasinghe, 2003).

- අධ්‍යාපන අවස්ථා පුළුල් වීම - 1881 වර්ෂයේ 3%ක්ව පැවති ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම 1921 වනවිට 21% දක්වා ඉහළ ගොස් තිබුණි. ස්ත්‍රීහු වෛද්‍ය, නීති, කලා, ශාස්ත්‍රාදී විෂයන් හැදෑරූහ (Jayawardene K., De Alwis M., 2001).

- නව රැකියා අවස්ථා බිහිවීම- පරිපාලන ක්ෂේත්‍රය, වතු වැවිලි, කර්මාන්ත හා වෙනත් සේවාවන්හි නව රැකියා අවස්ථා බිහිවිය. ගුරු, හෙද, ලිපිකරු ආදී වෘත්තීන් ස්ත්‍රීන් සඳහා බහුල විය (7 රූපය) (-එම-).

- ඡන්ද භාවිතය - ඡන්ද අයිතිය ද, මහජන නියෝජන අයිතිය ද මෙරට විසූ සෑම ජන කොටසකට ම අයත් ස්ත්‍රීන් විසින් හිමි කරගන්නා ලදී. කාන්තා සමිති සම්මේලනාදිය ද පිහිටුවා ගනු ලැබිණ (රූපය 7) (-එම-).

- ජීවන රටාවන් වෙනස්වීම - පහතරට ධනවත් පවුල්වල ස්ත්‍රීහු සමාජශීලී ජීවිතයක් ගත කළහ. ඔවුහු ඉංග්‍රීසි භාෂාව කථා කිරීමට ද, මෝටර් රථ හා පාපැදි පැදවීමට ද, ක්‍රීඩා හා සමාජ සේවාවන්හි නිරතවීමට ද හුරුවූ අතර එකල බටහිර රටවල ජනප්‍රිය නවීනතම ඇඳුම් විලාසිතා අනුකරණය කළෝය (රූපය 7) (-එම-).

- නව විනෝදාස්වාදන මාර්ග සහ සන්නිවේදන මාධ්‍ය බිහිවීම - පාර්සි, නූර්ති, මිනර්වා ආදී නාට්‍ය ද, දකුණු ඉන්දියානු සිනමාව ද මෙරටට හඳුන්වා දෙනු ලැබිණ. මුද්‍රණය ඇරඹීමෙන් පසු බිහි වූ පුවත්පත්, සඟරා ආදිය ද සාරිය හා විවිධ ඇඳුම් විලාසිතාවන් ස්ත්‍රීන් අතර ජනප්‍රිය වීම කෙරෙහි බලපෑවේ ය.

- මෙකල ඉන්දියාවේ මෙන් ම ලක්දිව ද අධිරාජ්‍ය විරෝධි, ස්වදේශීය හා ආගමික පුනරුද ව්‍යාපාර ඇරඹෙමින් තිබිණි. මෙම ව්‍යාපාර මඟින් මෙරට පැවති සාම්ප්‍රදායික සමාජ පිළිවෙත් සුරැකීම මූලිකත්වයෙහිලා සළකනු ලැබූ අතර සාම්ප්‍රදායික ඇඳුම් සහ දේශීය රෙදි පිළි භාවිතය සමාජයේ ප්‍රචලිත කිරීමට උත්සහ දරන ලදී. පියදාස සිරිසේන, ඩබ්.ඒ සිල්වා ආදීහු නවකතාවෙන් ද අනගාරික ධර්මපාල වැනි ස්වදේශ ව්‍යාපාරවල නායකයෝ ජනතා පුවත්පත් (*සිංහල බෞද්ධයා, සිංහල ජාතිය, ස්වරාජ්‍ය*) හා ප්‍රසිද්ධ දේශනාදිය මගින් ද හෙළ බොදු ආකල්ප, සිරිත් විරිත් ජනතාව අතර ස්ථාපිත කළහ.

ISSN 1800-1459



**8 රූපය** - ඩොනමෝර් කොමිෂන් සභාව යටතේ පත් වූ කාන්තා නියෝජන සමූළුවේ සාමාජික මණ්ඩලය.සිංහල, දෙමළ ආදී විවිධ ජාතීන්ගේ නියෝජනයක් මෙහි දක්නට ලැබේ.

1920 දශකයේ යුරෝපීය ස්ත්‍රීන්ගේ ඇඳුම් විලාසිතාව වූයේ ලිහිල් ගවුමකි (the Flapper). කොණ්ඩය කෙටිය (Bob cut, short curly hair), සීනු හැඩැති කුඩා තොප්පි (the Cloche) පළඳිති. ඉදිරිපස ආවරණය වූ පාවහන් පැළඳිති(Flapper shoes - pumps, ankle strap or bar shoes, loafers). ආභරණ දුර්ලභ ය. එකල ලක්දිව පහතරට නාගරික උගත් ධනවත් ස්ත්‍රීන් අතර ද මෙම විලාසිතාව ජනප්‍රිය විය. සාරිය සමඟ ඉහත කී ආකාරයේ පාවහන් හා මේස් පැළඳීම ද, හිස් ආවරණය කිරීම ද කොණ්ඩය කෙටි ව කැපීම ද විලාසිතාව බවට පත්විය.

මූලාශ්‍රය - Jayawardene, Kumari, De Alwis, Malathi, (2001) Casting Pearls: The women's franchise movement in Sri Lanka

අඳින හැට්ටය තමන්ගේ පයෝධර, බඩ සහ පිට සම්පූර්ණෙන් වැසෙන ලෙස ඇඳීම කළ යුතු ය. දස රියන් දිග රෙද්දකින් ඔරිසය හෙවත් සාරිය ඇන්ද යුතු ය. ඉන්දියාවේ වංගරට, මහාරාෂ්ට්‍ර, දෙමළ රට, කෂ්මීර, ගුර්ජරාරට කුල ස්ත්‍රීන්, කුල කුමාරීන් හැඳ පොරවන ඔහොරි වර්ග නොහොත් ඒක සාටක බොහෝ මිළට විකුණනු ලැබේ. ලංකාවේ උඩරට ස්ත්‍රීන් හැමෝම ඔහොරිය පෙරවීම කරන බව දක්නා ලැබේ. පහතරට ඔහොරිය ඇඳීම ලන්සි ආණ්ඩු කාලේ නවත්වන ලද්දේ ය. උඩරට සෑම ස්ත්‍රීන්ට ඔහොරිය සාධාරණයි. පහතරට සියලු ස්ත්‍රීන්ට ඔහොරිය හැඳ පොරවන්නට පුරුදු කටයුතු ය. පහතරට සිංහල ස්ත්‍රීන් ස්වල්ප දෙනෙක් විසින් ඔහොරිය පොරවන්නට පටන් ගෙන තිබේ. ඔහොරිය පොරවන්නට පළමුවෙන් පහතරට සිංහල ස්ත්‍රීන්ට මවිසින් අවවාද කළේ වෂී 1884 දීය. ඔහොරිය පොරවාගෙන මහබෝමැඩ වන්දනාවට කොළඹින් මගේ මැණියෝ ද උපාසිකාවුන් කීපදෙනෙක් ද පිටත්වුනෝය. කබා කැල්ලත් උදරය

ISSN 1800-1459

පෙණෙන්ට තනාගත් කොට හැට්ටයත් කුල ස්ත්‍රියකට යෝග්‍ය ඇඳුමක් නොවේ. ආර්ය ස්ත්‍රීන්ට යෝග්‍ය ඇඳුම ඔහොරියයි. ඔහොරිය නොහොත් සාරිය ද්‍රවිඩ, වංග, ඔඩ්ඩි, ගුජ්ර, මහාරාෂ්ට්‍ර රටවල ස්ත්‍රීන් එක අන්දමට අඳින්නේ නැත. කේරළ දේසේ කොච්චි ජාතික ස්ත්‍රීන්ගේ වස්ත්‍ර ඇඳීම රඹුක්කන පළාතේ හීන කුල ස්ත්‍රීන්ට සමානයි. මද්‍රාසියේ බ්‍රාහ්මණ ස්ත්‍රීන් අඳින සාරිය දිගින් රියන් දසසතරකි. වංග දේශීය කුල ස්ත්‍රීන් අඳින සාරිය දිගින් රියන් දසයකි. මහාරෂ්ට්‍ර ස්ත්‍රීන් සාරිය පිටපොටක් ගසා පොරවා ගන්නීය. ගුජ්ර රටේ ගුජරාතික ස්ත්‍රීන් අඳින සාරිය පාර්සි ස්ත්‍රීන් අඳින සාරියට සමානයි. මෙය ප්‍රියදර්ශනීය සෝබන ඇඳුමකි. මහාරෂ්ට්‍ර, ද්‍රවිඩ, ආන්ධ්‍ර රටවල ස්ත්‍රීන් හිස වසා ගන්නේ නැත. වංග, මගධ, කාසි, කෝසල රට ස්ත්‍රීහු හිස වසා ගනිත්. සියම් රට ස්ත්‍රීන් පිටපට ගසා වස්ත්‍ර ඇඳ ලේන්සුවක් නොහොත් රොමාලයකින් පයෝධර පමණක් වසා ගන්නීය. පහතරට සිංහල ස්ත්‍රීන් අඳින උදර පෙන්වන කොට හැට්ටය අශෝභන ඇඳුමකි. මෙවාර් රටේ ස්ත්‍රීන් වස්ත්‍රයකින් මුහුණ වසාගෙන උදරය පෙනෙන්ට සායක් ඇඳීම කරන්නී ය. මෙය අප්‍රිය දර්ශනයකි. උදරය පෙන්වන කොට හැට්ටය පමණක් ඇඳීම ස්ත්‍රී ලීලාවට අශෝභනයි. ඔහොරිය පොරවීම සකල ස්ත්‍රීන් කටයුතුයි. - අනගාරික ධර්මපාල (ගුරුගේ, 1991)



**9 රූපය** - වේදිකා හා සිනමා තාරකාවක් වන රුක්මණී දේවි, ප්‍රවීන ඇඳුම් නිර්මාණ ශිල්පියෙකු වන කීර්ති ශ්‍රී කරුණාරත්න විසින් දිනා ගන්නා ලද මෝටර් රථයක යතුර පිළිගන්වමින්, රුක්මණී දේවී හැඳ සිටින්නේ සාරියක පෙනුමැති ඇඳුමකි.

මූලාශ්‍රය - Jayathilaka, Kamalika (2011), Designs of a Life Time, Exlore Sri Lanka

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459

මෙකල, උඩරට සිංහල ස්ත්‍රීන් බෝරිච්චි යෙදූ සැට්ටය හා ඔසරිය ඇඳීමත්, පහතරට සිංහල ස්ත්‍රීන් චීත්තය හෝ කබාකුරුත්තු සමග මන්තය සහිත සැට්ටය ඇඳීමත්, ජා ස්ත්‍රීන් කම්බාය සහ කර පළල් ගෙඩි හැට්ට ඇඳීමත්, මුස්ලිම් ස්ත්‍රීන් ලොව්ච්චි හැට්ට ඇඳ මොට්ටැක්කිලියෙන් හිස වසා ගැනීමටත් උකුළු ඇටයෙන් පහළට වන සේ සුවිශේෂී ක්‍රමයකට සාරිය ඇඳීමත්[8], (හෙට්ටිආරච්චි, ඩී. ඊ., 1967) කොළඹ චෙට්ටි හා ද්‍රවිඩ ස්ත්‍රීන් ඉදිරිපසට පොට යොදා අඳින ගුජරාටි සාරිය, ආවේණික ක්‍රමයකට අඳින යාපනේ සාරිය හා දකුණු ඉන්දියානු කූර්ගා සාරිය ඇඳීමත් (Wimalarathne, 2001:1997) සිරිත් විය.



**10 රූපය** - ප්‍රවීන ඇඳුම් නිර්මාණ ශිල්පියෙකු වන කීර්ති ශ්‍රී කරුණාරත්නගේ සාරි විලාසිතා දැක්මක් (1956)

මූලාශ්‍රය - Jayathilaka, Kamalika (2011) Designs of a Life Time, Exlore Sri Lanka

දහ නව වන සියවස වනවිට මොරටුවේ කරාව කුලයට අයත් පහතරට සිංහල ස්ත්‍රීන් ඉන්දියානු සාරිය ඇඳීමට පෙළැඹීමෙන් එය පහතරට ඉහළ හා මධ්‍යම පාන්තික ස්ත්‍රීන් අතර ජනප්‍රිය ප්‍රවණතාවක් බවට පත්විය.

[8]මෙරට වාසය කරන මුස්ලිම් ස්ත්‍රීන්ගේ ප්‍රධාන ඇඳුම වන්නේ සාරියයි. මැලේ, මූවර්, බෝවර් ආදී සියලු මුස්ලිම් උප ජන කොටස් දහ හත් වන සියවසෙන් පමණ පසුව විවිධ කාලයන් තුළ වරින් වර උතුරු හා දකුණු ඉන්දියාවෙන් මෙරටට සංක්‍රමණය වූ අයයි. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ වෙළඳාමය. (මැලේ මුස්ලිම් ජන කොටස් උතුරු ඉන්දියාවේ වෙළඳ ජන ගෝත්‍රවලින් පැවත එන්නන් වෙත්.) (Nuhman M.A., 2007:204) ඉස්ලාම් ධර්මයට අනුව මුස්ලිම් ස්ත්‍රීහු ධාර්මික හා සංවරශීලී දිවිපැවැත්මකට සුදුසු යැයි සම්මත ඇඳුම් පරිහරණය කළ යුතුය. ඔවුහු පර්දාව පැළඳිය යුතුය. ශ්‍රී ලාංකේය මුස්ලිම් ජනයාගේ භාෂාව (ඔවුන්ගේ ප්‍රධාන භාෂාව ද දෙමළ ය) මෙන්ම ජනසම්ප්‍රදායයන් හා ඇඳුම් පිළිවෙත් ද ඉන්දියානු ආභාසයෙන් ලද ඒවා යැයි අනුමාන කළ හැකිය. එසේ ඉන්දියානු ක්‍රමයට සාරිය අඳින මුස්ලිම් ස්ත්‍රීන් ඉස්ලාම් දහමට අනුව හිස ආවරණ කර ගනු පිණිස යොදා ගන්නේ සාරියේ ම වලුපොටයි. එය දෙමළ භාෂාවෙන් **මුක්කාඩු** ලෙස හඳුන්වයි.

ISSN 1800-1459

මෙකල, සාරි පරිභෝජනයේ පමණක් නොව සාරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ද බොහෝ වෙනස්කම් ඇතිවිය. පශ්චාත් යටත් විජිත යුගයෙහි ස්වාධීන ලංකාණ්ඩුවක් යටතේ පේෂකර්මාන්තය - දේශීය රෙදි පිළි නිෂ්පාදනය - වැඩි දියුණු කෙරිණි. වෙළඳාම් දියුණුවිය. මහජනයාට ගුණාත්මක බවෙන් වැඩි භාණ්ඩ මිළට ගැනීමේ හැකියාව හිමිව තිබිණි. මධ්‍යම පාන්තික ජනයාට ප්‍රමාණවත් තරමේ රෙදිපිළි භාවිත කිරීමේ ප්‍රස්ථා උදාවිය. මෙකල බොහෝ පිරිස් උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගතවූ අතර ඒ පිරිස අතර පේෂකර්ම තාක්ෂණය, මෝස්තර නිර්මාණවේදය, කලාව ආදී විෂය ක්ෂේත්‍ර හැදෑරූ අය ද වූහ. ඔවුහු මෙරටට පැමිණ ආයෝජන ව්‍යාපාර ආරම්භ කළ අතර ඇතැමෙක් රාජ්‍ය දෙපාර්තමේන්තුවල සේවයට බැඳුණහ[9]. ලක්දිව පැවැති සාම්ප්‍රදායික ශිල්පක්‍රම හා මෝස්තර, බටහිර කලා මූලධර්ම සමඟ සංකලනය කරමින් ද, උසස් තාක්ෂණය භාවිත කරමින් ද රෙදිපිළි නිර්මාණය පිළිබඳ පර්යේෂණවල නියැලුණහ. (එවකට සිටි රාජ්‍ය නායිකාව විසින් මෙම ශිල්පීන්ගෙන් සේවා සපයාගන්නා ලද අතර එතුමිය වෙනුවෙන් කලාත්මක පින්තාරු ක්‍රම හා වර්ණ ගැන්වීම් ආදියෙන් අලංකරණය වූ සුවිශේෂ සාරි නිර්මාණය කරනු ලැබිණ.) ඔවුන් විසින් මෙරට ශිල්පීන් ද, වෘත්තිකයන් ද පුහුණු කරනු ලැබී ය. මෙසේ මෙරට රෙදි පිළි නිෂ්පාදනයේ ගුණාත්මක තත්වය ද, නිර්මාණාත්මක ලක්ෂණ ද වර්ධනය වන්නට විය.



11 රූපය - ඉන්දියානු සාරිය ඇඳ සිටින ස්ත්‍රීන් පිරිසක්


විනෝද ගමන් බිමන් ආදියේ දී ද එදිනෙදා සාමාන්‍ය කටයුතු සඳහා ද ස්ත්‍රීහු සාරිය ඇඳීමට හුරුවූහ. එකල බොහෝ උසස් හා වෘත්තීය අධ්‍යාපන ආයතනවල නිල ඇඳුම ලෙස භාවිත වූයේ සාරියයි.

මූලාශ්‍රය - www.oldcars.com

[9] මිනෙට් ද සිල්වා, රීනා ද සිල්වා, බාබරා සන්සෝනි, ස්වාති ජයවර්ධන, චන්ද්‍රාමණී තේනුවර, තිලක් සමරවික්‍රම මොවුන් බටහිර රටපවල විශ්වවිද්‍යාලවල හෝ සුප්‍රසිද්ධ කලා ශාස්ත්‍රාලයන්හි අධ්‍යාපනය ලබා ඇත

ISSN 1800-1459

විසිවන සියවස අග භාගයේ එනම්, හැත්තෑව දශකයෙහි නව ධනවාදී ආර්ථික ක්‍රම යටතේ සිදු වූ සමාජ විප්ලවයත් සමඟ මෙරට ස්ත්‍රීන් සමාජයේ නිරූපණය කළ භූමිකාව පුළුල් හා සංකීර්ණ එකක් බවට පත්විය. වෘත්තිය, දැනුම හා අධ්‍යාපන මට්ටම, සමාජීය කාර්යයන්, ජනසන්නිවේදන මාධ්‍ය, සමාජ ආකල්ප හා මතවාද, රුචිකත්වය සහ ධනය, ගෝලීය බලපෑම් ආදී විවිධ බාහිර හා අභ්‍යන්තර සාධක මත සාරියේ පරිභෝජන රටාවන්ගේ වෙනස්කම් ඇතිවිය. මේ අනුව සාරියේ වෙළඳපොළ තත්ත්වය ද, වෙනස්විය (රූපසටහන 1). එහෙයින්, වර්තමානයේ මෙරට සාරියේ වෙළඳපොළ තත්වය ඉතා පුළුල් වන බව පෙනේ.




රූප සටහන 1 - ශ්‍රී ලංකාවේ වර්තමාන සාරියේ වෙළඳපොළ තත්ත්වය හා සාරි පරිභෝජනය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459

## සංඥාර්ථවේදයː හැඳින්වීම

සංඥාවන් සහ අර්ථ අතර ඇති සම්බන්ධයේ රූපය විග්‍රහ කෙරෙන අධ්‍යයනය සංඥාර්ථවේදයයි (මල්ලිකාරච්චි, 2010). සම්ප්‍රදායයන්, සිරිත් විරිත් ආදී වූ සමාජ හා සංස්කෘතික ප්‍රපංචයන්ගේ ද භාෂා-ශාස්ත්‍රාදී ප්‍රකාශන ප්‍රකාරයන්ගේ ද සංඥාර්ථ විග්‍රහ කෙරෙන න්‍යායාත්මක එළැඹුමක් ලෙස සංඥාර්ථවේදය හඳුන්වාදිය හැකි ය. සංඥාර්ථවේදය, පුරාණයේ පටන් පෙර'පර දෙදිග දර්ශන, ශාස්ත්‍ර, විචාර හා මතවාද ඇසුරෙහි වර්ධනයවෙමින් පැවතුණකි. ක්‍රිස්තු පූර්ව යුගයේ පෙරදිග පාණිනී, භරතමුනි, අභිනවගුප්ත ආදී ශාස්ත්‍රඥයන්ගේ ඉගැන්වීම්වල ද, අපරදිග සොක්‍රටියානු ඉගැන්වීම්වල ද පසුකාලීනව, ඇරිස්ටෝටල් සහ ප්ලේටෝගේ ඉගැන්වීම්වල ද සංඥාර්ථ පිළිබඳ දාර්ශනික එළැඹුම් අන්තර්ගතව තිබූ බව සඳහන් වෙයි.

නූතන සංඥාර්ථවේදය දහ නව වන සියවස තරම් වූ මෑත යුගයක ප්‍රධාන ගුරුකුල දෙකක් යටතේ වර්ධනය විය. එයින්, යුරෝපීය සම්ප්‍රදායය වාග් විද්‍යාව හා භාෂාව මූලික කොටගෙන ෆර්ඩිනැන්ඩ් ඩි ෂෝසුවා (Ferdinand Saussure) විසින් ද, අමෙරිකානු සම්ප්‍රදාය දර්ශනය පදනම් කොටගෙන චාර්ල්ස් පියර්ස් (Charles Sanders Peirce) විසින් ද හඳුන්වා දෙන ලදී. පසුකාලීන ව ඇල්ගිඩාස් ග්‍රීමාස් (Algirdas Julius Greimas) වැනි ශාස්ත්‍රඥයන් ෂෝසුවාගේ සංඥාර්ථවේදය පිළිබඳ *ව්‍යුහවාදී න්‍යාය* සනාථ කරමින් යම් පඨිතයකින් (Text) එක් අර්ථයක් පමණක් උපදින බව පැවසුවත් ෂාක් ඩෙරීඩා (Jacques Derrida) වැනි ශාස්ත්‍රඥයෝ මෙම මූලික න්‍යාය එනම් එහි ව්‍යුහාත්මක පදනම විවේචනයට ලක් කළහ. රෝලන් බාත් (Roland Barthes), ජීන් බ්‍රෝඩිලා (Jean Baudrillard), උම්බතෝ ඉකෝ (Umberto Eco) ආදීහූ ද සංඥාර්ථ අතර පවත්නා ඒකමිතික සහ අකෘතිකමය න්‍යායන් තවදුරටත් බිඳහෙලමින් පශ්චාත් නූතන සමාජ සන්දර්භය තුළ සංඥාර්ථවල සංකීර්ණතා සහ ඒවායේ බහුඅර්ථමය ස්වරූප අධ්‍යයනය කරමින් සංඥාර්ථ විසංයෝජනය වන අයුරු පෙන්වා දුන්හ.




**12 රූපය** - සාරි වෙළඳ දැන්වීම් (සාරි අලෙවිකරණයේ දී සංකල්පමය අරුත් භාවිත වේ)

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459


## සාරියඃ සංඥාර්ථවේදී විග්‍රහය

වර්තමානයේ ඉන්දියාවේ පමණක් ජන වර්ග, ගෝත්‍ර, හා විවිධ සංස්කෘතීන් නියෝජනය කෙරෙන සාරියේ මූලික ප්‍රභේද සියයකට අධික ය. සාරියේ ප්‍රාදේශීය නාමයන් ද, ප්‍රාදේශීය හා ජන ගෝත්‍රවලට ආවේණික වූ වියමන් සහ මෝස්තර රටා ද බොහෝය (Lynton, 1995). ඉන්දියාවේ සාරි නිපැයුම්හල්වලින් දේශීය පරිභෝජනය සහ අපනයනය පිණිස වසරකට නිපදවන සාරි ප්‍රමාණය මිලියන ගණනකි; විවිධ වෙළඳපොළ තත්ත්ව නියෝජනය කෙරෙන සාරි අලෙවිසල් ද දස දහස් ගණනෙකි. මේ නිසා ලක්දිව ස්ත්‍රීන් විසින් පරිහරණය කරනු ලබන සාරිය, ඉන්දියානු සාරිය තරම් සංකීර්ණ සමාජ සන්දර්භයකට අයත් නොවන බව ද ආකෘතිකමය වශයෙන් වන විවිධතාවන් දක්නට නො ලැබෙන බව ද සඳහන් කළ යුතු ය.

සාරියේ අර්ථ නිෂ්පත්තිය සිදුවන්නේ එහි ද්‍රව්‍යාත්මක පැවැත්ම මත ය. එනම්, සාරියේ

- අමුද්‍රව්‍ය සහ නිපැයුම ක්‍රම
- අලංකරණ මෝස්තර
- ඇඳීමේ පිළිවෙත්
- පැළඳුම් ආදී ආනුභූතික ලක්ෂණ මත සහ
- එහි ප්‍රායෝගික උපයෝගීතාව අනුවය

සංඥාර්ථවේදය සත්තව සංඥා හැදෑරීම පිණිස භාවිත වූ සහ භාවිත කළ හැකි ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන තිබේ (Zoosemiotics). සත්ත්ව සංඥා බිහිවන්නේ (ජීව විද්‍යාත්මක ව - Biological) සහජයෙනි. මානව සංඥා මිනිසා විසින් නිර්මාණය කරගන්නා ලදුව සංස්කෘතිකමය පදනමකින් ප්‍රභවය ලබයි. එසේ බිහිවන සංඥා ප්‍රජානනික අන්තර්ගතයකින් යුක්ත ය (Cognitive Component). එම සංඥා පාරම්පරිකය; ඇතැම් විට ඒවාට පන්ති පදනමක් තිබේ; එහෙයින්ම ඒවා පරිහරණය කිරීමේ දී ඒ ගැන උගැන්මට ද, ඒවාට අනුගතවීමට (adaptation) ද සිදුවේ. ඒ අනුව, චින්තනය හා සම්ප්‍රදායයන් ඇසුරෙන් එනම්, විවිධ සංස්කෘතීන් තුළ සාරියේ භෞතික පැවැත්ම අරභයා වන සංඥාර්ථ නිෂ්පන්න වේ.




සාරිය යනු සමාජ හා සංස්කෘතික ප්‍රපංචයකි. සාරිය සමාජ තත්ත්වවල දර්ශකයකි. විවිධ සමාජ සම්මුතීන්ට අනුකූල ව සාරිය අර්ථ ගැන්වෙයි. මේ අර්ථ හුදු

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459

සන්නිවේදනය සඳහා පමණක් නොව සමාජ හා සංස්කෘතික සම්බන්ධතා ජාලයක් නිර්මාණය කිරීමට ද උපකාරී වෙයි. (සංඥාර්ථවේදයේ සංස්කෘතික පදනම හා සමාජ විද්‍යාත්මක ලක්ෂණ පළමුවරට විග්‍රහ කරන ලද්දේ පියර්ස් විසිනි. එය සමාජ සංඥාර්ථවේදය ලෙස හැඳින්වෙයි. රෝලන් බාත් ද සංඥාර්ථවේදයේ ඉහත කී සමාජ හා සංස්කෘතික පදනම පිළිබඳ අධ්‍යයනය කළ සංඥාර්ථවේදියෙකි). වර්තමානයේ, සාරිය සංස්කෘතික ප්‍රපංචයක් සේම පරිභෝජන භාණ්ඩයක් ලෙස ද හඳුන්වා දිය යුතු ය. එහෙයින් සාරියේ සංස්කෘතික අගැයුම් තීරණය වන්නේ එහි ආර්ථික වටිනාකම් හා සෞන්දර්යාත්මක අගැයුම්වලට අනුකූලව ය. සාරිය අරභයා වන එවැනි ඇගයුම් හා අර්ථ, අතීතයේ සමාජ සම්මුතීන් විසින් නියම කරන ලද අර්ථවලට වඩා වෙනස්ය, සුවිශේෂී ය.

දහ නව වන සියවස තෙක් ලක්දිව පැවති වැඩවසම් සමාජ ක්‍රමය තුළ ස්ත්‍රීන්ගේ ඇඳුමේ පිළිවෙත්වල ඒකමිතියක් දක්නට ලැබුණු බව සඳහන් කරන ලදී. ජනයාගේ දිවි පැවැත්ම සමාජ ස්ථරායණයට අනුකූල ව සමාජ සම්ප්‍රදායයන් මඟින් තීරණය විය. කාමභෝගී දිවියක් ගත කරනු පිණිස ප්‍රභූවරුන්ගේ ජන ජීවිතය ඉසුරෙන් ආඪ්‍ය විය. විචිත්‍ර වියමන් රටා සහිත මටසිලිටු දිගු වස්ත්‍ර හැන්දේ ද වටිනා ලෝහ හා පාෂාණාදියෙන් කළ ආභරණ පැළැන්දේ ද ප්‍රභූන් විසින් පමණි. වස්ත්‍රවල විචිත්‍රවත් ඇඳීමේ විලාසයත්, ආභරණ බාහුල්‍යයත් දක්නට ලැබිණි[10]. රාජකීයයන්ගේ හා ප්‍රභූවරුන්ගේ වස්ත්‍රාභරණ පිළියෙල කර ගැනීම පිණිස විදේශ රටවල සිට මෙරටට ශිල්පීන් ගෙන්වා ගන්නා ලදී. ඒ ශිල්පීන්ට ඔවුන්ගෙන් සපයාගන්නා සේවාකම් සඳහා ගම්වර ආදිය ප්‍රදානය කිරීම පුරාණයේ පටන් පැවති ආ සිරිතකි (Coomaraswami, 1907). බලය සංකේතවත් කිරීම, රාජකීය ප්‍රියසම්භාෂණ, උත්සව සැණකෙළි (කාමෝත්සව වැනි) ආදී සමාජ දේශපාලන අවශ්‍යතා සඳහා මහාර්ඝ වස්ත්‍ර පරිහරණය කිරීම සමාජ අවශ්‍යතාව විය. පුළුල් වාග් කෝෂයක් ඇති තැනැත්තාට භාෂාවෙන් ප්‍රකාශ කළ හැකි අර්ථ බොහෝ වන්නා සේ ඇඳුමෙන් අර්ථවත් කළ යුතු හා කළහැකි, බොහෝ දෑ ප්‍රභූන් සතුවිය (Jennifer, 1994).


ඇඳුම පිළිබඳ එවැනි සංකීර්ණ අවශ්‍යතාවන් සාමාන්‍ය ජනයාට නො තිබිණි. උපයෝගීතාව පමණක් මූලික විය. දණෙන් ඉහළ වැසෙන සේ හැඳීමට ප්‍රමාණවත් වූ රෙදි කඩෙක දෙකොණ ඉණ වටා දැවටීමෙන් සාමාන්‍ය ජනයාගේ වස්ත්‍ර පිළියෙල වූ අතර ඒවා ප්‍රාථමික-සරල ලක්ෂණවලින් යුක්ත විය. පඬු පොවා පිළියෙල කරගත් දළ රෙදි කඩක් පමණක් හැඳීමට සාමාන්‍ය ජනයා අවසර ලද්දෝය. රෙදි වියමන හා වස්ත්‍ර පිළියෙල කිරීමේ කාර්ය සිදුවූයේ ද සමාජ රීතීන්ට අනුකූලව ය. ආචාරි (ශිල්පියෝ), හන්නාලි (මහන්නෝ), හාලි (පේෂකාරයෝ), ආදී රෙදි පිළි නිෂ්පාදනයේ සේවාකම් කරන්නෝ පවා කුල ධූරාවලියේ ඒ ඒ ස්ථර නියෝජනය කළහ.

මේ අනුව ශත වර්ෂ ගණනාවක් පුරා ඇඳුම් පිළිවෙත් එක්තරා සමාජ සංස්කෘතික ව්‍යුහයක් තුළ ස්ථාපිත වූ බව පෙනේ. සොෂුවාගේ විග්‍රහයට අනුව සංඥාකාරකය (signifier) හා සංඥිතය (signified) ඒකීය ලෙස බද්ධවීමෙන් බිහිවන සංඥා

[10] එකල කුලීන ජනයා කය සරසා ගත්තේ රෙදි පිළියෙන් නොව වටනා ආභරණයෙනි. මුක්තාවලි හර්සක සූත්‍ර යන ආභරණ බෙල්ල ද, කෙයුර මණිබන්ධ යන ආභරණ බාහු යුවළ ද, ත්‍රිසර ද හාර නමැති දික් වූ මාලය ද ග්‍රීවය මෙන් වක්ෂස ද උදර බන්ධනය බඳ ද තරල සූත්‍රක යන දාමයන් කටී ප්‍රදේශය ද අලංකාර කළ කලෙක දැන් මෙන් උඩුකය වසා ගැනීම සිරිත නොවීය (වික්‍රමසිංහ 1935:107)

ISSN 1800-1459

(signs), ව්‍යුහයක්[11] තුළ ගැලපීමෙන් (structural relationship) අර්ථ නිර්මාණය වන්නා සේ ඇඳුම්වල සංඥා නියත වූ සමාජ ක්‍රමයක් තුළ අර්ථවත් විය. ඒවායේ අර්ථ සමාජ සම්මුතීන්වලින් වෙන් කොට හඳුනාගත නො හැකි ය. සංඥාවන්ගේ වටිනාකම තීරණය වන්නේ ඒවා ඊට අදාළ ව්‍යුහය තුළ අනෙක් සංඥා සමඟ සබැඳෙන ආකාරය අනුව ය. එම ව්‍යුහය සංස්කෘතික ය. කුලීනයන්ගේ ඇඳුම අර්ථවත් වන්නේ කුලහීනයන්ගේ ඇඳුම් අරභයා වන සංඥා හා ඒවායේ අර්ථවලට අනුකූලව ය. සමාජ ස්ථරායණයේ ඒ ඒ ස්ථර තුළ දිවි ගෙවන ජනයාගේ ඇඳුම් පිළිවෙත් හා දිවි පැවැත්ම අනෙක් ස්ථරයේ පිළිවෙත් සමඟ මිශ්‍රණය වන්නේ නැත (රූපසටහන 1). එසේ හෙයින් ඒවායේ සංඥාර්ථ නියත ය. ඒ එක් එක් සංඥාවක් අනෙක් සංඥා සමඟ නියත ලෙස ඒකාබද්ධ වී සංඥාර්ථ පද්ධතියක් නිර්මාණය කරයි.




**රූප සටහන 2** - සාම්ප්‍රදායික සමාජය තුළ ඇඳුමේ සංඥාර්ථ හා ඒවායේ ඒකමිතික සම්බන්ධය


සංඥාර්ථ නිර්මාණය වන්නේ කාලීන හා අවකාශමය වශයෙනි. ඉංග්‍රීසි පාලන සමයේ මෙරට ජනයා විසින් ඇඳුම භාවිත කරන ලද්දේ ජාතිකත්වය (සාම්ප්‍රදායික ඇඳුම) හඟවනු පිණිස ය, නැතහොත් බටහිර ගැති බව (බටහිර ඇඳුම) දක්වනු පිණිස ය. ස්වදේශීය ව්‍යාපාර නායකයෝ ඉංග්‍රීසි පාලනයට විරුද්ධ ව ඇඳුම/සාරිය සංකේතයක් ලෙස භාවිත කළ අතර එය සිංහල කුල ස්ත්‍රියගේ සංවර බව හා ප්‍රෞඪත්වය දැක්වීමේ දර්ශකයක් ලෙස පෙන්වා දුන්හ.

ලංකාවේ හම්බ, මරක්කල, දෙමළ, බොම්බයිකාර, ලන්සි, පාරසී සමූහයා දක්නා ලැබේ. ජාතික වස්ත්‍ර, ජාතික නාම, ජාතික චාරිත්‍ර උල්ලංඝණය නොකොට යටකී ජාතිහු පවත්වත්....... ගවුන් ඇඳගෙන පැදුරු පන් තොප්පි හිස දමා ගෙන මෙලච්ඡ නාම ආරූඪ කරගෙන යුරෝපීය දුශ්චරිත භාරගෙන සිංහල ස්ත්‍රීන් පිරිහීමට පැමිණ සිටින්නීය. (අනගාරික ධර්මපාල) (ගුරුගේ, 1991)

ඇඳුමේ (හෝ සාරියේ) සංඥාර්ථ භෞතික වශයෙන් ද, පුද්ගලික හා සංස්කෘතිකමය වශයෙන් ද තීරණය කෙරේ (Damhorst, 2005) (රූපසටහන 3).

[11] වාග් විද්‍යාවේ අර්ථ = වචනය + ශබ්දය + ශබ්දාර්ථය ආදියෙහි ඒකීයත්වයෙන් ගොඩ නැගෙන්නා සේ.

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30*
*ISSN 1800-1459*



රූප සටහන 3 ඩැම්හොස්ට් විසින් ඉදිරිපත් කරන ලද ඇඳුමේ සංඥා පිළිබඳ ආදර්ශය Damhors-t's Conceptual Model of **Clothing Sign System**

ඉහත සඳහන් කළ පරිදි, දහ නව වන සියවස වන විට ලක්දිව ස්ත්‍රීන්ගේ ඇඳුම් පිළිවෙත් ආදියෙහි ද එහෙයින් ඒවායේ සංඥාර්ථවල නියත බව ද ක්‍රමයෙන් වෙනස්වන්නට විය (වගුව 1).

වගුව 1 - විවිධ යුගවල බිහි වූ සමාජය ක්‍රමයන් තුළ ඇඳුමේ සංඥාර්ථ තීරණය වූ ආකාරය


| [illegible] | [illegible] | [illegible] | |
|---|---|---|---|
| [illegible] | [illegible] | [illegible] | |
| | **[illegible]** | | |
| [illegible] | [illegible] | [illegible] | [illegible] |
| | **[illegible]** | | |
| [illegible] | [illegible] | [illegible] | |
| | **[illegible]** | | |
| [illegible] | [illegible] | [illegible] | |
| | **[illegible]** | | |

1980 දශකයේ ධනවාදී අර්ථ ක්‍රමය ස්ථාපිතවීමෙන් අනතුරු ව මෙරට සමාජ තත්වයන් මෙහෙයවනු ලැබුවේ ආර්ථික සාධක මගිනි (රූප සටහන 4). මේ නිසා මෙම සමාජය තුළ සංඥාර්ථ තීරණය වූයේ වෙළඳ හා ආර්ථික වටිනාකම් අනුව ය. අතීතයේ පටන් පැවති සාම්ප්‍රදායික සමාජ හා සංස්කෘතික නියතයන් තවදුරටත් මෙම සමාජය තුළ පැවතිය ද ඒවායේ සංඥාර්ථ ක්‍රමයෙන් අහෝසිවෙමින් පැවතුණි. ධනවාදී අර්ථ ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම යටතේ ඕනෑම පුද්ගලයෙකුට අධ්‍යාපනය ලැබීමේ අයිතිය හිමිව තිබූ අතර ධනය ඉපැයීමට ද, එයින් සම්පත් හා ඉසුරු භුක්ති විඳීමට ද ඉඩ ප්‍රස්ථා උදාවිය.

ISSN 1800-1459

පුරාණයේ, කුලය හා සමාජ පංතිය නිසා හිමි වූ වරප්‍රසාද මෙම සමාජක්‍රමය යටතේ අධ්‍යාපනය හෝ ධනය ආදී කරුණු නිසා වෙනස්කම්වලට ලක්විය. සාරිය විසින් නියෝජනය කරන ඕනෑම සමාජ තත්ත්වයකට ඕනෑම පුද්ගලයෙකුට පිවිසිය හැකි ය. මේ නිසා එයින් නියත වශයෙන් අර්ථවත් වන්නේ කුමක්දැයි තීරණය කළ නො හැකි ය. නිදසුනක් ලෙස; ඔසරියේ සාම්ප්‍රදායික ඇගයුම් හා එහි සංඥාර්ථ කවරේදැයි තීරණය කළ හැකිවන්නේ, පහතරට උගත් ධනවත් ස්ත්‍රීන් විසින් අඳිනු ලබන අනර්ඝ ඉන්දියානු සාරිය සමඟ සැසඳීමෙන් සහ නූතන සමාජ හා ආර්ථික සාධක රැසක් සලකා බැලීමෙන් අනතුරුව ය. වරෙක සමාජ කාරණා මත අර්ථවත් වන එහි සංඥාවක් තවත් වරෙක ආර්ථික සාධක නිසා විසරණය වනු දක්නට ලැබේ.

1990 දශකයෙන් පසුව සන්නිවේදන මාධ්‍ය, ගෝලීයකරණය, තොරතුරු තාක්ෂණය හා දෘශ්‍ය සංස්කෘතිය ආදී වෙනත් බාහිර සාධකවල බලපෑමෙන් ඇඳුමේ/සාරියේ සංඥාර්ථ නව මානයන් යටතේ තව දුරටත් වෙනස්වන්නට විය. සංකල්ප, මතවාද විසින් සංඥාර්ථ නිර්මාණය කරනු ලැබිණ (රූප සටහන 4).




රූප සටහන 4
ඇඳුමේ සංඥා පිළිබඳ නූතන ආදර්ශය
Extended Version of Damhorst's Conceptual Model of **Clothing Sign System**

මෙම තත්වය යටතේ නූතනයේ ඇඳුමෙහි සංඥා අතිශය සංකීර්ණ වන අතර ඒවා අතර සම්බන්ධතාව ද ඒකීය නොවන බව පෙනීයයි. පශ්චාත් ව්‍යුහවාදීන්ගේ විග්‍රහයට අනුව මේ සංඥාර්ථ නියත නැත. ඇඳුම අනේක විධ ප්‍රපංචයන් සමඟ සම්මිශ්‍රණයවෙමින් හා තවත් වරෙක විසිරෙමින්, විසංයෝජනය වෙමින් සංඥාර්ථ නිපදවයි. ඇතැම් සංඥිතයන් හා සංඥාකාරකයන් මිශ්‍රවීමෙන් වෙනම ම

*ISSN 1800-1459*

ආකාරයක සංඥා බිහිවනු දක්නට ලැබේ. එක් සංඥාවක් තවත් සංඥාවක සංඥාකාරකයක් බවට පත්වීමෙන් සංඥාවල බහු අර්ථ නිපදවයි (වගුව 2).

**වගුව 2 - නූතන සමාජය තුළ සංඥාර්ථ විසංයෝජනය වන ආකාරය**

<table>
<tr><td>සංඥාකාරකය</td><td>සංඥිතය</td><td></td></tr>
<tr><td colspan="2">සංඥාව<br>සංඥාකාරකය</td><td>සංඥිතය</td></tr>
<tr><td colspan="3">සංඥාව</td></tr>
</table>

සාරියේ සංඥාර්ථ විමසනු පිණිස කරනු ලබන ශාස්ත්‍රීය අධ්‍යයනයන් එහි නිෂ්පාදන ක්‍රියාවලියේ දි ද, අලෙවිකරණයේ දි ද පරිභෝජනයේ දි ද වැදගත් වනු ඇත. මේ අනුව, මෙම සංකීර්ණ සමාජ සන්දර්භය තුළ පවත්නා නියත සංඥාර්ථ හඳුනාගැනීමත් ඊට අනුකූල සංකල්පමය අරුත් නිර්මාණය කිරීමත් වෙසෙසින් ම, අලෙවි ප්‍රවර්ධන කාර්යයේ දි සහ ඇඳුම් ප්‍රචාරණය පිළිබඳ මාධ්‍ය සන්නිවේදනයේ දි අත්‍යවශ්‍ය වන්නේ ය.

## නිගමනය

සාරිය යනු, දොළොස් රියනක් පමණ දික් වූ තනි රෙද්දක්, සිරුර වටා එතීමෙන් පිළියෙල කරගනු ලබන සාම්ප්‍රදායික ස්ත්‍රී ඇඳුමකි. සාරිය හුදු පාරිභෝජන භාණ්ඩයක් ලෙස පමණක් නොව සමාජ-සංස්කෘතික ප්‍රපංචයක් ලෙස ද, එසේ හෙයින්, එය සංඥාර්ථ පද්ධතියක් ලෙස් ද මෙම අධ්‍යයනයේ දි හඳුනාගනු ලැබිණි.

වසර දහස් ගණනක සිට විවිධ සමාජ හා සංස්කෘතික සන්දර්භයන් තුළ සාරිය අර්ථ ගැන්වුණු ආකාර බොහෝ ය. එහෙත් අතීතයේ පටන් පැවති සාම්ප්‍රදායික සමාජ හා සංස්කෘතික නියතයන් මත පදනම් වූ සාරියෙහි අර්ථ වර්තමාන සමාජය තුළ ක්‍රමයෙන් අහෝසිවෙමින් පවතී. අතීතයේ සමාජ සම්මුතීන් විසින් නියම කරනු ලැබූ සංඥාර්ථවලට වඩා වර්තමානයේ සාරියට හිමි සංඥාර්ථ වෙනස් ය; සුවිශේෂී ය. එම සංඥා අතිශය සංකීර්ණ වන අතර ඒවා අතර සම්බන්ධතාව ද ඒකීය නො වන බව දක්නට ලැබේ. වර්තමානයේ සාරිය අනේක විධ ප්‍රපංචයන් හා සන්දර්භයන් සමඟ සම්මිශ්‍රණය වෙමින් ද, තවත් වරෙක විසිරෙමින් ද, විසංයෝජනය වෙමින් ද නානාප්‍රකාර සංඥාර්ථ නිපදවයි.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459

වගුව 1

| | සංඥාකාරකය | | සංඥිතය | සංඥාව |
|---|---|---|---|---|
| | සාරිය | සාරිය හා සබැඳෙන අනෙකුත් පැළඳුම් හා ආයිත්තම්[1] | | |
| 1 | තනි පැහැති සාරිය සහ සාරියේ රෙද්දෙන් ම මසන ලද හැට්ටය (ෂිෆෝන්, ජෝජට්, නයිලෝන්, නයිලෙක්ස්, ඔගැන්සා, ලිනන්, හෝ කපු) සිහින් බෝඩරය කුමානුකූලව රැලි තබා පිළියෙල කරගත් දිගු සාරි පොට හා ඉණ ඔපනැලි | උස් සාමාන්‍ය පාවහන්, අත් ඔරලෝසුව, කාන්තා අත් බෑගය කුඩය, සාරි කටුව, ලේන්සුව කුඩා ප්ලාස්ටික් ආබරණ හෝ කෙටි සිහින් රන් මාලය, වළලු | පිළිගැනීමේ නිලධාරිනියක්, වැඩ සුපරීක්ෂකවරියක් | රැකියාව, සමාජ තත්වය, වෘත්තිය නියෝජනය |
| 2 | ද්විතික දළ වර්ණයේ (matt colours) සුමට රෙද්දෙන් කළ සාරිය, කර සහ අත් ද උඩුකය ද පූර්ණ ලෙස වැසෙන සේ ඇඳි හැට්ටය ලිහිල්ව මුදා හරින ලද කෙටි සාරි පොට බතික්, පෙතම් පිළි, අත් පින්තාරු, තුල් වැඩ, මැහුම් කුම, අත් වියමන් ආදියෙන් අලංකරණය කළ දුර්ලභ මෝස්තර | උපැස් යුවල, සැහැල්ලු විශාල හෝ දිගු අත් බෑගය ලිපි ගොනු ආබරණ නොමැති හෝ අලංකරණ මෝස්තර සහිත දුර්ලභ අමුද්‍රව්‍යයෙන් කළ ආබරණ සැහැල්ලු පැතලි අඩි සහිත සුවපහසු පාවහන් | රජයේ මාණ්ඩලික නිලධාරිනියක්, කලාශිල්පිනියක්, වෛද්‍ය, නීති ආදි වෘත්තීන්වල නියැලෙන ස්ත්‍රියක් | උසස් රුචිකත්වය, බහුශ්‍රැත බව, වෘත්තිය, ඉහළ සමාජ තත්වය, සෞන්දර්යාත්මක ඇගයුම්, අලංකරණය |
| | | අලංකරණ මෝස්තර සහිත දුර්ලභ අමුද්‍රව්‍යයෙන් කළ රන්, රිදී පබළු හෝ වටිනා පාෂාණයෙන් කළ ආබරණ උස් සිහින් අඩි සහිත පාවහන් වටිනා අමුද්‍රව්‍යයෙන් කළ අමුතු හැඩයේ කුඩා අත් බෑගය | උත්සවයකට හෝ මංගල අවස්ථාවකට සහභාගි වන පෙර දක්වන ලද (2) සමාජ පන්තියේ ස්ත්‍රියක් | |
| 3 | තනි පැහැති සාරිය සහ හැට්ටය (නිල ඇඳුම) | ආබරණ නොමැත, සාමාන්‍ය සැහැල්ලු සෙරෙප්පු, නිල ලාංඡනය | ආරක්ෂක නිලධාරිනියක් (Security Guard-female) | රැකියාව, පහළ සමාජ තත්ත්වය, |
| 4 | බෝරිච්චි හැට්ටය සහ උල් පොට යෙදූ කපු ඔසරිය, දිගු ඉණ නරුව අත් වියමන් ආදියෙන් අලංකරණය කළ කුඩා මල් මෝස්තර | හාරිච්චිය, හවඩිය, ගෙඩි වළලු, අගස්ති මාල, කොණ්ඩ කූරු[2] | උඩරට කුලීන සිංහල ස්ත්‍රියක් | වංශවත් බව, සාම්ප්‍රදායික බව, ඉහළ සමාජ තත්ත්වය, ආඪ්‍යය, වරප්‍රසාදලත්, ගෞරවනීය |
| 5 | කුමානුකූල ව රැලි තබා පිළියෙල කරගත් හෝ නොගත් දිගු සාරි පොට සහ ඉණ ඔපනැලි ෂිෆෝන්, ජෝජට්, නයිලෝන්, නයිලෙක්ස්, ඔගැන්සා, ලිනන්, හෝ කපු ආදියෙන් නිමැවූ සාරිය, කුඩා මල් මෝස්තර | සාමාන්‍ය පාවහන් හෝ සෙරෙප්පු, අත් ඔරලෝසුව, කාන්තා අත් බෑගය, කුඩය, සාරි කටුව, මල්ල, ලේන්සුව | ගුරු, ලිපිකරු ආදි වෘත්තීන්වල නියැලෙන ස්ත්‍රියක් | රැකියාව, උපයෝගිතාව සාමාන්‍ය සමාජ තත්ත්වය |

[1] සංඥාකාරකයක් ලෙස වැදගත්වන ආලේපන හා කේශාලංකරණ ගැන අනිවාර්යයෙන් සඳහන් කළ යුතු වුවත් ලේඛනයේ දීර්ග බව සළකා ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් නොකෙරේ.

[2] ඔසරියට පැළඳි සාම්ප්‍රදායික ග්‍රීවාභරණ - හංස පට්ටි, මකර, හේරුණ්ඩ මෝස්තර සහිත පදක්කම් මාල, සත්පෑව මාල, සිරිබෝ මාල, සුරවැල්, පොල්මල් මාල, බැබිල මාල, වැටකේ මාල, අරළු මාල, රන් බෝ කොළ මාල, අගස්ති මාල; හවඩි- තාරුකා හවඩි, ගෙඩි හවඩි, පෙති හවඩි; වළලු - කංකනාද, ගෙඩි වළලු, කොරල්, කම්බි, වීදුරු, අවුල්හැර; මුදු- කණ්සාලි මුදු, අවුල් මුදු, අගස්ති මුදු, නවරත්න මුදු, දිමුති කේවු

සබරගමුව විශ්වවිද්‍යාලයීය සාහිත්‍ය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 1-30
ISSN 1800-1459

වගුව 2

| | සංඥාකාරකය | | සංඥිතය | සංඥාව |
|---|---|---|---|---|
| | සාරිය | සාරිය හා සම්බන්ධ අනෙකුත් පැළඳුම් හා ආයිත්තම් | | |
| 6 | කුම්භාඬුකුලව රැලි නැති පිළියෙල කරගත් දිගු සාරි පොටව හා ඉණ බඳනැලි<br>දිස්නිමත් වර්ණයේ සාරිය, කර ඇඳුමට නැඟුණු හැට්ටය<br>විශාල රන් හෝ රිදී කුඩලන් වැඩ දැමූ බෝඩරය (glittery)<br>විශාල මල්, හැඩතල, ඉරි සහිත මෝස්තර | මිලවත් ගිහින් අඩි සහිත ඉතා උස් පාවහන් (උසස් තත්වයේ)<br>රන්, රිදී, මුතු, හෝ වටිනා පාෂාණයෙන් කළ ආභරණ, උසස් තත්වයේ අත් ඔරලෝසුව, ලිපි ගොනු<br>වටිනා අමුද්‍රව්‍යයෙන් කළ වෙනස් හැඩයේ විශාල කාන්තා අත් බෑගය, උපැස් යුවල. | ජ්‍යෙෂ්ඨ්ගලීන අංශයේ කළමණාකාර, විධායක තනතුරක් දරන ස්ත්‍රියක්, ව්‍යාපාරික පවුලක ධනවත් ස්ත්‍රියක් | ධනය, වරප්‍රසාදලත් (privileged, superior),<br>වංශවත් - high-ranking, විචිත්‍ර හා ආඩම්බර බව (bejeweled, flamboyant) |
| 7 | කුම්භාඬුකුලව රැලි නැති පිළියෙල කරගත් දිගු සාරි පොටව හා ඉණ බඳනැලි රන් හෝ රිදී කුඩලන් වැඩ දැමූ දිලෙන වර්ණයේ (gleaming) සාරිය, අඟුටු හැඩයකට මනා ඝෝෂිම කළ විචිත්‍ර හැට්ටය, විශාල බෝඩරය | අලංකරණ මෝස්තර සහිත දුර්ලභ අමුද්‍රව්‍යයෙන් කළ රන්, රිදී පබළු හෝ වටිනා පාෂාණයෙන් කළ විශාල ආභරණ<br>ඉතා උස ගිහින් අඩි සහිත පාවහන්<br>වටිනා අමුද්‍රව්‍යයෙන් කළ අමුතු හැඩයේ කුඩා අත් බෑගය | උත්සවයකට හෝ මංගල අවස්ථාවකට සහභාගී වන පෙර දක්වන ලද (6) සමාජ පන්තියේ ස්ත්‍රියක් | |
| 8 | දිස්නිමත් තද වර්ණයේ සාරිය (තද රතු, කොළ) හා වෙනත් වර්ණයක හැට්ටය | විශාල තිලකය, පාවහන් රහිත, විශාල කන් හා නාසේ කෝඩු ගිහින් වළලු, සාරියට උඩින් ඉණට හැදි රෙද්ද | වතු කම්කරු දෙමළ ස්ත්‍රියක් | දිළිඳු බව, පීඩිත පහළ සමාජ තත්වය,<br>සාම්ප්‍රදායික බව |
| 9 | හැට්ටය සහ ඔසරිය | මල් කළඹ, හිස පැළඳි ඉරට තද පදක්කම, හිස් පළඳනාව, මාල හාර, මංගල නැල්ල, අත් මුදු, පළඳනාව, හාරිච්චිය, තාච්චිය, ගෙඩි වළලු, | උඩරට සිංහල මනාලියක් | සාම්ප්‍රදායික බව, මංගල සළකුණු |
| 10 | දිස්නිමත් තද වර්ණයේ මණිපුරි සාරිය (තද රතු, කහ), කුම්භාඬුකුලව රැලි හෝ පිළියෙල කරගත් දිගු සාරි පොටව හා ඉණ බඳනැලි<br>කර සහ අත් ද උඩුකය ද පූර්ණ ලෙස වැසෙන සේ ඇඳි හැට්ටය<br>රන් හෝ රිදී කුඩලන් වැඩ දැමූ විශාල බෝඩරය (glittery) | විශාල තිලකය, පාවහන් රහිත, පාෂාණයෙන් අලංකරණය වූ රන් 'මට්ටල්' - කන් කෝඩු, හා මූක්කුත්ති - නාසේ කෝඩු, ගිහින් වළලු, පා සළඹ, පා මුදු, වච්චි පට්ටම් මාල, හිස පැළැඳි මල් වැල | කුලීන දෙමළ ස්ත්‍රියක් | වංශවත් බව, සාම්ප්‍රදායික බව, ඉහළ සමාජ තත්වය, ආඪ්‍යය, වරප්‍රසාදලත් |

ISSN 1800-1459

# පරිශීලිත මූලාශ්‍රය


අමරසිංහ, මාලිංග (2000) *සිංහලයේ පුරාණ ඇඳුම් ආයිත්තම්*, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම

කරුණාරත්න, ඩේවිඩ් (1964) *අනගාරික ධර්මපාල*, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම

*මධ්‍ය කාලීන සිංහල කලා* (1962) (*පරි.*) එච්. එම්. සෝමරත්න කොළඹ, ලංකාණ්ඩුවේ මුද්‍රණය

ගුරුගේ, ආනන්ද (සංස්) (1991) *ධර්මපාල ලිපි*, කොළඹ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

*මහාවංශය* (1991) ගුරුගේ, ආනන්ද (පරි) කොළඹ, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

මල්ලිකාරච්චි, ඩෙස්මන්, (ප්‍රස්ථාවනාව), *වෙස් නැටුම්; සංඥාර්ථවේදාත්මක කියැවීමක්* (2010) මන්තිලක එස්., බත්තරමුල්ල, විශද ප්‍රකාශන

මුදියන්සේ, නන්දසේන (1963) *සීගිරි ගී* ප්‍රථම භාගය

වික්‍රමසිංහ, මාර්ටින් (1935) *පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම*, දෙහිවල, සීමාසහිත තිසර ප්‍රකාශකයෝ

වියන්ගොඩ, ගාමිණී (2008) *සිංහලේ අවසාන රජතුමා හා කෝල්බෲක් ප්‍රතිසංස්කරණ*, කොළඹ, සහජීවන කේන්ද්‍රය

Amunugama, Sarath, (1979) "Ideaology and Class Interest in One of Piyadasa Sirisena's Novels; The New Image of the Sinhala Buddhist Nationalist", *Sri Lanka Collective Identities Revisited Vol* – 1 (ed) Micheal Roberts, (1997), Colombo 6, Marga Institute

Arunachalam P. (1907) "Population: The Island Races, Religions, Languages, Customs and Costumes", *Twentieth Century Impressions of Ceylon*, (Ed.), Arnold Wright, London, Lloyds Great Britain Pub. Co.

Banerjee, Mukulika, Miller Daniel (2003) *Berg*, Oxford International Publishing Ltd.

Barthes, R. (1967) *The Fashion System*, (trans.) M.Ward and R. Howard (1990) Berkeley

Bourdier, P (1984) *Distiction; A Social Critique of the Judgment of Taste*, London, Routledge & Kengan Paul

Coursey, Robert D. (1973) *Clothes Doth Make the Man, in the Eye of the Beholder*, Perceptual and Motor Skills, (www.amsciepub.com/doi/pdf)

Chandler, D. (2005) *Semiotics: The Basics*, London, UK, Routledge

ISSN 1800-1459


Coomaraswami, A.K., (1907) *Native Arts & Handicrafts, Twentieth Century Impressions of Ceylon*, (Ed.), Arnold Wright, London, Lloyds Great Britain Pub. Co.

Damhorst M.L.,Miller-Spillman K.A., Michelman S.O., ed. (2005) *The Meanings of Dress*, 2nd ed., New York, Fairchild Pub.

Davy, John (1821) *An Account of the Interior of Ceylon and of Its Inhabitants with Travels in that Island*, (පරි.) යසපාල වනසිංහ, ජෝන් ඩේවි දුටු උඩරට රාජ්‍යය සහ එහි වැසියෝ, කොළඹ, එස්. ගොඩගේ සහෝදරයෝ

Dearborn, George Van Ness (1918) *The Psychology of Clothing, Princeton*, NJ and Lancaster, PA: Psychological Review Co.

Dharmadasa, K.N.O., (1979) "The Sinhala Buddhist Identity and the Nayakkar Dynasty in the Politics of the Kandyan Kindom;1739 – 1815", *Sri Lanka Collective Identities Revisited Vol* – 1 (ed) Micheal Roberts, (1997) Colombo 6, Marga Institute

Eco, U. (1976) *A Theory of Semiotics*, Bloomington, Indiana Univerasity press

Geiger, W.; Bode M.H. (1960) (trans.). *The Mahavamsa, or the Great Chronical of Ceylon*, Colombo, Ceylon Government Information Department

Horn, Marilyn J. (1968) *The Second Skin: An Interdisciplinary Study of Clothing*, Boston: Houghton Mifflin Co.

Hussein, Asiff, (2009) *Zeylanica; A Study of the People and Languages of Sri Lanka*, Pannipitiya, Neptune Publication

Jayawardena, Kumari., De Alwis, Malathi., (2001) *Casting Pearls: The women's Franchise Movement in Sri Lanka*, Colombo, Social Scientists' Association

Jayawardena, Kumari (1993) Mary Rutnam: *A Canadian Pioneer for Women's Rights in Sri Lanka*, Colombo, Social Scientists' Association

Jennifer, Craik (1994) The Face of Fashion: Cultural Studies in Fashion, Routledge

Knox, R., (1958) repr., *An Historical Relations of Ceylon*, Dehiwala, Thisara Prakashakayo

Lasswell, Thomas E. and Parshall, Peter F. (1961) *The Perception of Social Class from Photographs*, Sociology and Social Research.

Laver, James (1969) *Modesty in Dress, An Inquiry Into the Fundamentals of Fashion Boston*; Houghton Mifflin Co.

Lynton, Linda (1995) *The Sari*, London, Thames & Hudson Ltd

Nuhman M.A. (2007) *Sri Lankan Muslims, Ethnic Identity within Cultural Diversity*, Colombo, International Centre for Ethnic Studies

Peirce, Charles Sanders (1931-1966) *The Collected Papers of Charles Sanders Peirce*, C. Hartshorne, P. Weiss, and A. W. Burks (eds.). Cambridge, MA: Harvard University press

Stanley Robert, Burgoyne Robert, Fittrmen Sandy (1992) *New Vocabularies in Film Semiotics*, Routledge

Ratnayake, Hema, *Jetavana: Stupa and Monastery Complex, The Cultural Trangle of Sri Lanka* (1993) UNESCO publication. CCF, Colombo, Aitken Spence Printing (Pte) Ltd

Roberts, Micheal, (1979) "Elite Foramation and Elites 1832 – 1931", *Sri Lanka Collective Identities Revisited Vol* – 1 (ed) Micheal Roberts, (1997) Colombo 6, Marga Institute

Veblen, Thorstein (1953) *The Theory of the Leisure Class*, New York: The New American Library

Wickramasinghe, Nira, (2003) *Dressing the Colonized Body*, New Delhi, Orient Longman

Wimalarathne K.D.G., Gomes D. (2001) *Costumes of Sri Lanka*, South Korea, Samhuwa Printing Co. Ltd

## කෝෂ ග්‍රන්ථ

සෝරත, වැලිවිටියේ (1999-තෘතීය මුද්‍රණය) ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, කොළඹ, එස්. ගොඩගේ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1967) *සිංහල විශ්වකෝෂය*, පළමු කාණ්ඩය කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව

*සිංහල ශබ්දකෝෂය*, (1965) පස්වන කාණ්ඩය කොළඹ, රාජකීය ආසියාතික සමිතිය, ලංකා ශාඛාව

## පුවත්පත් ලිපි

Jayathilaka, Kamalika, (2011) *Designs of a Life Time*, Exlore Sri Lanka, Decemebr, Vol. 25, Number 08, Colombo, Aitken Spence Printing and Packaging (Pvt) Ltd .

Jayawardane, Sita, (1960) *The Story of the Saree*, Times of Ceylon, Christmas Number

Rathanasara, Thiranagama, (1954) *Ancient Textiles of Ceylon*, Ceylon Today, Vol 4

Serasinghe, Irangani (1960) *Fashion in Ceylon Through Ages*, Times of Ceylon, Ceylon Annual

Rosenfeld, Lawrence B. and Plax, Timothy G. (1977) *Clothing as Communication*, Journal of Communication,Vol.27, June.

Vallipuram, Yoga (1964) *Jewellry of the Sri Lankan Tamil Women*, Times of Ceylon, Ceylon Annual

වෙබ් අඩවි

www.oldcars.com